2020



වාර්ෂික කාර්ය සාධන වාර්තාව

வருடாந்த செயற்றிறன் அறிக்கை

Annual Performance Report

රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව
அரசாங்க தகவல் திணைக்களம்
Department of Government Information

වාර්ෂික කාර්ය සාධන වාර්තාව

2020



රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව

නො.163, කිරුළපන මාවත,

පොල්හේන්ගොඩ,

කොළඹ 05.

2020 වර්ෂය සඳහා වාර්ෂික කාර්යසාධන වාර්තාව

රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව

වැය ශීර්ෂ අංකය : 210

අන්තර්ගතය

	පටුන	පිටුව
පරිච්ඡේදය 01 -	ආයතනික පැතිකඩ / ක්‍රියාවට නැංවීමේ සාරාංශය	1 - 12
පරිච්ඡේදය 02 -	ප්‍රගතිය හා ඉදිරි දැක්ම	13 - 19
පරිච්ඡේදය 03-	වසරේ සමස්ථ මූල්‍ය කාර්ය සාධනය	20 - 47
පරිච්ඡේදය 04-	කාර්ය සාධන දර්ශක	48 - 50
පරිච්ඡේදය 05 -	තිරසාර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය	51 - 53
පරිච්ඡේදය 06 -	මානව සම්පත් පැතිකඩ	54 - 57
පරිච්ඡේදය 07-	අනුකූලතා වාර්තාව	58 - 71
	අවසානය	72 - 73

01
පරිච්ඡේදය

ආයතනික පැතිකඩ / ක්‍රියාවට නැංවීමේ සාරාංශය

ආයතනික පැතිකඩ / ක්‍රියාවට නැංවීමේ සාරාංශය

1.1. හැඳින්වීම

1.2. ආයතනයේ දැක්ම, මෙහෙවර, අරමුණු

1.3. ප්‍රධාන කාර්යයන්

1.4. සංවිධාන සටහන

1.5. අමාත්‍යාංශය යටතේ පවතින දෙපාර්තමේන්තු/ දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අංශ/ දිස්ත්‍රික් ලේකම් කාර්යාලය යටතේ පවතින ප්‍රාදේශීය ලේකම් කාර්යාල

1.6. අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව/ පළාත් සභාව යටතේ පවතින ආයතන/ අරමුදල්

1.7. විදේශ ආධාර ලබන ව්‍යාපෘතිවල තොරතුරු (තිබේ නම්)

අ). ව්‍යාපෘතිය

ආ). දායක නියෝජිතායතනය

ඇ). ව්‍යාපෘතියේ ඇස්තමේන්තු ගත වියදම - රු.මි.

ඈ). ව්‍යාපෘති කාල සීමාව

1.1. හැඳින්වීම

බ්‍රිතාන්‍ය යටත් විජිතවාදී පාලන සමයේ දෙවන ලෝක යුද්ධ කාල පරිච්ඡේදයේදී යුද තොරතුරු පිළිබඳව ජනතාව දැනුවත් කිරීම සඳහා "War Information Centre" ක්‍රියාත්මක විය.

ලෝක යුද්ධය නිමා වීමත් සමඟ එම යුද තොරතුරු ලබා දීමේ මධ්‍යස්ථානය රජයේ සංවර්ධන කාර්භාරය පිළිබඳව ජනතාව දැනුවත් කිරීම සඳහා "රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව" නමින් අලුත් ආයතනයක් ලෙස ස්ථාපිත කිරීමට පියවර ගෙන තිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස 1948 ජූලි මස 31 වැනිදා සෝල්බරි කොමිෂන් සභාවේ උපදෙස් හා නිර්දේශ මත කොළඹ ගාලු මුවදොර මහලේකම් කාර්යාල සංකීර්ණයේ පළමු වතාවට රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව ස්ථාපිත කරන ලදි. ආරම්භයේදී රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව,

1. ප්‍රවෘත්ති සැපයීම් අංශය
2. ආණ්ඩුවේ පොත්පත් ආයතනය සහ
3. ආණ්ඩුවේ චිත්‍රපට අංශය යන අංශ තුනෙන් සමන්විත විය.

මේ අනුව රජය ඉටු කරනු ලබන ජාතික සංවර්ධන කාර්යභාරය ජනතාව අතරට ගෙන යාම සඳහා ප්‍රධාන කාර්යයන් තුනක් මුල් කරගෙන, ප්‍රධාන අංශ තුනක් යටතේ ස්ථාපිත කළ රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ එම ප්‍රධාන කාර්යයන් බවට පත් වූයේ,

01. රජයේ සංවර්ධන ප්‍රවෘත්ති හා ප්‍රචාරක කටයුතු මෙහෙයවීම
02. රජයේ ප්‍රකාශන කාර්යාංශය මඟින් රජයේ නිල ප්‍රකාශන ජනතාව අතරට ගෙන යාම (මුද්‍රණය කිරීම හා බෙදා හැරීම)
03. රජය විසින් ඉටු කරනු ලබන ජාතික සංවර්ධන කාර්යභාරය පිළිබඳව ගම් මට්ටමින් ජනතාව දැනුවත් කිරීම සඳහා රජයේ චිත්‍රපට අංශය මඟින් වාර්තා චිත්‍රපට නිපදවා ප්‍රදර්ශනය කිරීම

ගාලු මුවදොර මහලේකම් කාර්යාල සංකීර්ණයේ සිට ආයතනයේ එක්, එක් අංශ වරින්වර, තැනින් තැන ස්ථාපිත කර තිබේ. ඒ අතර ජාවත්ත වාරිමාර්ග දෙපාර්තමේන්තු ගොඩනැගිල්ල, මොරටුව පොල්වත්තේ වෙලෝනා ගොඩනැගිල්ල, කොටුව ට්‍රාන්ස්වර්ක් මන්දිරය, ශ්‍රීමත් බාරොන් ජයතිලක මාවත - අතපත්තු ගොඩනැගිල්ල දැක්විය හැකිය. 90 දශකයේ දී කොල්ලුපිටිය පෞද්ගලික ගොඩනැගිල්ලක මහල් දෙකක පවත්වාගෙන ගිය දෙපාර්තමේන්තුව එවකට රජයේ චිත්‍රපට අංශය පවත්වා ගෙන ගිය පොල්හේන්ගොඩ පරිශ්‍රයට ගෙනැවිත් තිබේ. එතැන් සිට එම පරිශ්‍රයේ නව ගොඩනැගිලි ඉදිකරමින් ආයතනයේ විවිධ අංශ එකම පරිශ්‍රයකට ගෙන ඒමට ආයතන

ප්‍රධානීන් කටයුතු කර ඇත. එහි ප්‍රතිඵලයක් ලෙස මනා සේවයක් ඉටුකිරීම සඳහා කාර්ය මණ්ඩලයට ලබා දෙන ත්‍යාගයක් ලෙස එම පරිශ්‍රයේම ආයතනයේ යටිතල පහසුකම් සවිමත් කරමින් ඉදිකරන ලද පස් මහළින් සැදි නව මාධ්‍ය සංවර්ධන මධ්‍යස්ථානයට 2012 මාර්තු 30 වැනිදා සුභ මොහොතින් ගෙවදින ලදි.

වර්තමානයේ රජයේ ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජනරාල් ධුරය දක්වා ආයතන ප්‍රධානියාගේ තත්වය උසස් වී ඇති නමුත් ආරම්භයේදී එම තනතුර ප්‍රවෘත්ත්‍යාධිකාරී නම් විය. 1948 ආරම්භක ප්‍රවෘත්ත්‍යාධිකාරී වූයේ පී.නඩේශන් මහතාය. ප්‍රවෘත්ත්‍යාධිකාරී, ප්‍රවෘත්ති අධ්‍යක්ෂ හා ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජනරාල් දක්වා ආයතන ප්‍රධානී තනතුර උසස් වී තිබේ.

මෙකී කාර්යභාරය ඉටු කිරීම සඳහා පළපුරුදු, දක්ෂ ජනමාධ්‍යවේදියෙකු මෙන්ම පුවත්පත් කතුවරයෙකු වූ එච්.ඒ.ජේ.හුළුගල්ල මහතා රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ප්‍රවෘත්ති නිලධාරියා ලෙස පත් කරනු ලැබීය. එසේම සහකාර ප්‍රවෘත්ති නිලධාරීන් ලෙස පී.එන්.මැද්දේගොඩ, එල්.ආර්.ගුණතිලක, එස්.පී.වෙත්තසිංහ, පී.බී.විජේසිංහ යන මහත්වරුන් කටයුතු කර තිබේ.

ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ප්‍රකාශයක් වන "දෙසතිය" සඟරාව මුද්‍රණද්වාරයෙන් එලි දැක්වීම එවකට රාජ්‍ය අමාත්‍යාංශයේ ලේකම්ධුරය දැරූ ජ්‍යෙෂ්ඨ අමාත්‍ය, ආචාර්ය සරත් අමුණුගම මහතාගේ සංකල්පයක් මත 1978 පෙබරවාරි 4 වැනිදා "දෙසතිය" සඟරාවේ මංගල කලාපය නිකුත් කිරීමත් සමග ආරම්භ වන්නේ ශ්‍රී ලාංකේය ජනසන්නිවේදන මාධ්‍යයේ හැරවුම් ලක්ෂයක් ලෙසය. එය යුග ගණනාවක් පසු කරමින් තීරණාත්මක සන්ධිස්ථාන පසුකර අඛණ්ඩව ජන මනස පෝෂණය කරමින් සිටින මුද්‍රිත මාධ්‍යයකි.

"සක්වල අතැඹුලක්" කළ දෙසතිය විසින් පෝෂණය වූ ලේඛක පරම්පරාවන් බොහෝය. පාඨක පරම්පරාව ද බොහෝය. මෙරට ප්‍රතිපත්ති තීන්දු කරන්නාගේ සිට ගොවියා, කම්කරුවා දක්වා නියෝජනය කරන ශ්‍රී ලංකාවේ රාජ්‍ය අංශයෙන් ක්‍රියාත්මක කළ එකම පුවත් සඟරාව වන්නේ ද "දෙසතිය" යි. විශේෂයෙන්ම රජයේ ප්‍රතිපත්ති, සංවර්ධන වැඩපිළිවෙල ජනතාගත කිරීමේ ප්‍රධාන වගකීම උරට ගත් දෙසතිය ඉන් ඔබ්බට ගොස් ජන මනසේ බුද්ධිමය විප්ලවයක් ඇති කිරීමට සමත් වෙයි. සමාජීය, ආර්ථික, සංස්කෘතික, කලා, ජාත්‍යන්තර සහ තවත් බොහෝ ක්ෂේත්‍රයන් පිළිබඳ තොරතුරු ඉතාමත් සරල බස් වහරක් යොදා ගනිමින් පාඨක රුචිය වඩවන ලෙස ඉදිරිපත් කිරීමට දෙසතිය සඟරාව සමත් වී තිබේ.

දෙසතියට අමතරව "තොරතුරු" නමින් සතිපතා පුවත්පතක් ද, "Alliance" නමින් ඉංග්‍රීසි පුවත්පතක් ද එකල පල කර තිබේ.

ඉතා සුළු කාර්යමණ්ඩලයක් යටතේ ආරම්භ කළ රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ 2020 වර්ෂය අවසානය වන විට ස්ථීර, අනියම්, කොන්ත්‍රාත් හා දෛනික සේවාවන්හි නිරතව සිටින සේවක සංඛ්‍යාව 237ක් විය.

රජයේ ආයතන අතර ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව සුවිශේෂී වැදගත්කමක් දරන ආයතනයක් වන්නේ එය සෘජුවම මහජනතාවට පුවත් සපයන මාධ්‍ය ආයතන සමඟ සම්බන්ධ වන ආයතනය වන බැවිනි. ඉන් නිකුත් කෙරෙන නිවේදනයක් රජයේ නිවේදනයක් වන්නා සේම එය අතිශයින් නිවැරදි තොරතුරුවලින් සමන්විත විය යුතුමය.

එසේ පුවත් සපයන අතර එක්, එක් වකවානුවලදී රජය ගන්නා තීරණ අනුව කටයුතු කිරීමට ද සිදු වී ඇත. 1979, 1980, 1981, 1983,1987,1995,1996 හා 2000 යන වර්ෂවලදී රජය පුවත් වාරණය සිදු කළ අතර එම අවස්ථාවල රටේ කලබලකාරී වාතාවරණයක් පැවතීම ඊට හේතු විය. එවැනි අවස්ථාවලදී පුවත් වාරණය කිරීම රජයේ නිසි බලධරයා ලෙස ප්‍රවෘත්ති අධ්‍යක්ෂවරයාට පැවරුණු රාජකාරියක් විය.

1993 දී රූපවාහිනී නාලිකාවන්ට ප්‍රථම වරට ප්‍රවෘත්ති ප්‍රචාරය කිරීමට රජය අවසරදීම මෙරට මාධ්‍ය ඉතිහාසයේ වැදගත් සිදුවීමක් ලෙස සැලකිය හැකි වේ. මීට සමගාමීව මහජනයාට අවශ්‍ය තොරතුරු පහසුවෙන් ලබා ගැනීම සඳහා 1995 මැයි 18 වැනිදා ජාතික තොරතුරු මධ්‍යස්ථානය බිහි කිරීම රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ තවත් එක් ඉදිරි පියවරක් විය. එම මධ්‍යස්ථානය කොළඹ කොටුව, ට්‍රාන්ස්වර්ක්ස් මන්දිරයේ ආරම්භ කෙරිණි. ඒ සමඟම මාධ්‍යවේදීන් අතර සුහදත්වය වර්ධනය කිරීම සඳහා “Press Club” එහි පිහිටුවන ලදි.

ට්‍රාන්ස්වර්ක්ස් මන්දිරයෙන් දෙපාර්තමේන්තුව හදිසියේ ඉවත් කරන ලද අතර පසුව කොල්ලුපිටියේ පෞද්ගලික ගොඩනැගිල්ලක මහල් දෙකකට ආයතනය ගෙන ගොස් තිබේ.

රාජ්‍ය ජනමාධ්‍ය ව්‍යුහයේ පැවති සීමාකම් හඳුනාගෙන ජනතාව වඩාත් සංවර්ධන කාර්යභාරයට දායක කර ගැනීම රජයේ අරමුණ වූයෙන්, විශේෂයෙන් රජයේ කෘෂි කාර්මික නවෝදය, ප්‍රජාතන්ත්‍රවාදය ශක්තිමත් කිරීම, සර්වජන ඡන්ද බලයේ ජනතා මෙහෙවර යනාදී කරුණු පිළබඳව ජනතාව දැනුවත් කිරීමේදී රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවට පැවරුණු වගකීම වඩාත් සාර්ථකව ඉටු කිරීමට රජයේ චිත්‍රපට අංශය, ප්‍රකාශන කාර්යාංශය ඉතා පුළුල් මෙහෙවරක් එදා යුගයේදී ඉටු කර තිබේ.

ආරම්භක යුගයේ සිටම රජයේ ප්‍රචාරන වැඩපිළිවෙළ දේශීය වශයෙන් පමණක් නොව ජාත්‍යන්තර වශයෙන් ද ඉටු කළ රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකාවේ විදේශ තානාපති කාර්යාල ඉලක්ක කර ගෙන අත්පත්‍රිකා, සඟරා හා ප්‍රකාශන නිතිපතා බෙදා හැරීමට ද කටයුතු කර තිබේ. මෙම කාල පරිච්ඡේදයේදී විදේශ තානාපති කාර්යාල ඉලක්ක කර ගෙන පළ කරනු ලැබූ “Week Happening in the Island” සඟරාවද “Introduction Ceylon” ආදී ප්‍රකාශන තුළින් ශ්‍රී ලංකාව පිළිබඳව විශේෂ තොරතුරු විදේශ රටවලට ලබා දීමට කටයුතු කර තිබේ. පසු කාලයේදී ශ්‍රී ලංකාව පිළිබඳ තොරතුරු විදේශයන්හි ප්‍රචාරය කිරීම සඳහා “Sri Lanka Today” නමින් තෛමාසික සඟරාවක් ද පළ කර තිබේ.

රජයේ ප්‍රකාශන කාර්යාංශය ද ඉතා පුළුල් අරමුණක් යටතේ පවත්වාගෙන යමින් රජයේ නිල ප්‍රකාශන පිළිබඳව නීති, අණපනත් මහජනතාවට මිලදී ගැනීම සඳහා මුද්‍රණය කර බෙදා හැරීමට කටයුතු කර තිබේ. මෙහි ආරම්භක නිලධාරියා ලෙස සේවය කර ඇත්තේ R.V.H.Vantwest මහතාය.

ජුලියෝ පෙට්ට්‍රෝනි මහතාගෙන් ආරම්භ වූ රජයේ චිත්‍රපට අංශය, නිදහසින් පසු මෙරට සිදු වූ ජාතික සංවර්ධනය පිළිබඳව මහජනතාව දැනුවත් කිරීම සඳහා සුවිශාල මෙහෙවරක් ඉටු කර ඇත. ඒ වාර්තා චිත්‍රපට නිෂ්පාදනය මඟිනි. පසුකාලීනව කීර්තිමත් වාර්තා චිත්‍රපට අධ්‍යක්ෂවරුන් රාශියක් බිහි කළ මෙම අංශය, පැරිස් ජාත්‍යන්තර චිත්‍රපට උළෙල ආදී විදේශ සිනමා සම්මාන උළෙලවල් රාශියකදී වාර්තා හා අර්ධ වාර්තා අංශයෙන් ශ්‍රී ලංකාවට සම්මාන දිනා දී ඇත.

1948 නිදහසත් සමඟ ඇති කරන ලද දෙපාර්තමේන්තු ආකෘතිය යටතේ යාවැකි උපරිමය දක්වා යන, සිය ගමන් මඟේ එදාට වඩා පසුගිය වර්ෂවල නවීන ලෝකයට ගැලපෙන ආකාරයෙන් සංවිධිත වී ඇති රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව 2020 වන විට අංශ කිහිපයකින් සිය සේවාවන් පවත්වා ගෙන යනු ලැබේ. රජයේ චිත්‍රපට අංශය, ඡායාරූප අංශය, රජයේ සමාජ මාධ්‍ය ඒකකය, දෙසතිය සඟරා අංශය, නව මාධ්‍ය ඒකකය (www.news.lk), රජයේ ප්‍රකාශන කාර්යාංශය, මාධ්‍ය හැඳුනුම්පත් අංශය, ප්‍රචාරක අංශය සහ පර්යේෂණ හා විමර්ශන අංශවලින් සමන්විත රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව ක්‍රියාකාරී ආයතනයක් බවට මේ වන විට පත් වී ඇත.

මෙම කාර්යභාරය කාලීන වෙනස්කම්වලට ලක් වෙමින් වර්තමානය දක්වාම සාර්ථකව ක්‍රියාත්මක කිරීමට රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව යුහුසුළු වනවාක් මෙන්ම පවත්නා යාන්ත්‍රණයන් තුළින් ඒ සඳහා ඉඩ හසර වෙන් කර ගන්නා බවද නිරීක්ෂණයේදී පැහැදිලි වේ.

රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ ආයතන ප්‍රධානීන් .....

1948 සිට රජයේ ප්‍රවාත්ති දෙපාර්තමේන්තුවේ ආයතන ප්‍රධානීන් ලෙස ප්‍රවෘත්ත්‍යාධිකාරී, ප්‍රවෘත්ති අධ්‍යක්ෂ සහ ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජනරාල් යන තනතුරු නාම දරමින් පහත නිලධාරීන් කටයුතු කර ඇත.

1948 - පී.නඩේශන් මහතා

1949 - ඩී.අයි.එච්.ඒ.ජේ.හුළුගල්ල මහතා

1950 - වී.ටී.ආර්.විවියන් හොරයින් මහතා

1952 - ඩී.අයි.එච්.ඒ.ජේ.හුළුගල්ල මහතා

1955 - නඩේශන් පරරාජශිංගම් මහතා

1956 - ජී.ලයනල් පෙරේරා මහතා

1957 - ජී.ඩබ්.ඒ.එම්.පෙරේරා මහතා

1958 - ජේම්ස් පෙරේරා මහතා

1959 - ටී.එම්.ජයරත්නම් මහතා

1960 - තිලක් එරංග ගුණරත්න මහතා

1961 - ඩබ්.එල්.ප්‍රනාන්දු මහතා

1962 - එස්.බී.සේනානායක මහතා

1966 - ඩී.අළුවිහාරේ මහතා

1967 - පී.එන්.මැද්දේගොඩ මහතා

1968 - ආචාර්ය එස්.එල්.බී.අමුණුගම

1972 - පී.එච්.ප්‍රේමවර්ධන මහතා

1974 - ඩබ්.ආර්.පී.තිලකරත්න මහතා

1977 - එස්.අනුර ගුණසේකර මහතා

1983 - මානෙල් අබේරත්න මහත්මිය

1990 - කේ.එස්.විමලසේන මහතා

1991 - කේ.ආර්.එල්.විජේවර්ධන මහතා

1992 - මහාචාර්ය සුනන්ද මද්දුමබණ්ඩාර

1994 - ආරිය රුබසිංහ මහතා

2003 - කේ.ඒ.බී.ජේ.පී.ජයසේකර මහතා

2004 - ඩබ්.එම්.පියසේන මහතා

2005 - කාන්ති විජේතුංග මහත්මිය

එස්.ඩී.පියදාස මහතා

2006 - වී.පී.කේ.අනුෂ පැල්පිට මහතා

ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජනරාල්වරුන් .....

2009.02.01 සිට 2010.05.06 දක්වා	-	වී.පී.කේ.අනුෂ පැල්පිට මහතා
2010.05.07 සිට 2015.01.08 දක්වා	-	මහාචාර්ය ආරියරත්න ඇතුගල
2015.01.13 සිට 2015.05.07 (වැ.බ.)	-	කේ.ඩබ්.ටී.එන්.අමරතුංග මහත්මිය
2015.05.08 සිට 2017.06.02	-	ආචාර්ය දර්ශනී ගුණතිලක
2016.06.06 සිට 2017.09.29 දක්වා	-	ආචාර්ය රංග කලන්සූරිය
2017.10.13 සිට 2018.10.26	-	නීතීඥ සුදර්ශන ගුණවර්ධන මහතා
2018.10.27 සිට මේ දක්වා	-	නාලක කලුවැව මහතා

වාර්ෂික කාර්යසාධන වාර්තාව - 2020

දැක්ම

"නිදහස් හා වගකීමෙන් යුතු මාධ්‍ය සම්ප්‍රදායක් උදෙසා දායක වීම"

මෙහෙවර

"ශ්‍රී ලාංකේය සන්නිවේදන මාධ්‍ය අතර සුහදශීලී පරිසරයක් නිර්මාණය කිරීම හා මාධ්‍ය සංස්කෘතිය නඟා සිටුවීම සඳහා අවශ්‍ය මෙහෙයවීම සිදුකරමින් නිවැරදි තොරතුරු හා රජයේ දැක්ම දැන ගැනීමට ඇති අයිතිය තහවුරු කිරීම"

අරමුණු

- රාජ්‍ය ප්‍රතිපත්ති හා සංවර්ධන ක්‍රියාදාම ඇතුළුව ජාතික වැදගත්කමකින් යුතු කාලීන ක්‍රියාකාරකම් පිළිබඳ මහජනතාව දැනුවත් කිරීම
- උසස් මාධ්‍ය සංස්කෘතියක් ගොඩනැඟීම
- වෘත්තීය ජනමාධ්‍ය සංස්කෘතියක් ගොඩනැඟීමට අනුබලදීම හා නායකත්වය සැපයීම
- ඉහත අභිමාර්ථ සපුරා ගැනීම සඳහා මානව හා භෞතික සම්පත් සංවර්ධනය කිරීම
- ගෝලීය තාක්ෂණ ප්‍රවණතාවයන්වලට අනුගත වෙමින් (ඩිජිටල්කරණය) තොරතුරු තාක්ෂණය, ගෝලීය ප්‍රවණතාවයන්ට අනුකූලව කළමනාකරණය කිරීම

1.3. ප්‍රධාන කාර්යයන්

- ප්‍රමිතිගත මාධ්‍ය සම්ප්‍රදායක් ඇති කිරීම

- තොරතුරු දැන ගැනීමේ අයිතිය ප්‍රවර්ධනය කිරීම සඳහා රජයේ සංවර්ධන ප්‍රචාරන වැඩ පිළිවෙල පිළිබඳ තොරතුරු ජනතාව වෙත ගෙන යාම


- මාධ්‍ය විමර්ශන ක්‍රියාවලිය ශක්තිමත් කිරීම

- යහපාලනය, සංහිඳියාව, තිරසාර සංවර්ධනය ස්ථාපිත කරමින් ප්‍රකාශනයේ හා භාෂණයේ නිදහස තහවුරු කිරීම

- වෘත්තීය මාධ්‍යවේදීන් බිහි කිරීම

- මාධ්‍ය ක්ෂේත්‍රයට අදාළ පර්යේෂණ කටයුතු, සංවර්ධන හා සැලසුම් ඇති කිරීම

1.4. සංවිධාන සටහන



**. නිලධාරියාගෙන් පසු තනතුර අහෝසි වීමට යටත්ව අනුමත වී ඇති තනතුරු නාම

1.5. දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අංශ

01. පාලන අංශය
02. ගිණුම් අංශය
03. ප්‍රචාරක අංශය
04. රජයේ සමාජ මාධ්‍ය ඒකකය
05. නව මාධ්‍ය ඒකකය
06. දෙසතිය හා දෙසතිය බෙදා හැරීම් අංශය
07. ඡායාරූප අංශය
08. රජයේ චිත්‍රපට අංශය
09. දිස්ත්‍රික් මාධ්‍ය ඒකක අංශය
10. මාධ්‍ය හැඳුනුම්පත් අංශය
11. ඩිජිටල් යටිතල පහසුකම් අංශය
12. රජයේ ප්‍රකාශන කාර්යාංශය
13. පර්යේෂණ හා මාධ්‍ය විමර්ශන අංශය
14. පුස්තකාලය

1.6. අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව/ පළාත් සභාව යටතේ පවතින ආයතන/ අරමුදල්

රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව යටතේ පවතින ආයතන නොමැත

1.7. විදේශ ආධාර ලබන ව්‍යාපෘතිවල තොරතුරු

රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ විදේශ ආධාර ලබන ව්‍යාපෘති නොමැත

02
පරිච්ඡේදය

ප්‍රගතිය හා ඉදිරි දැක්ම

ප්‍රගතිය හා ඉදිරි දැක්ම

සෑම විටම නව තාක්ෂණය මුසුකර ගනිමින් සන්නිවේදනයේ නව තාක්ෂණික ප්‍රමුඛතා සමඟ සමගාමීව රජයේ නිල පුවත් සන්නිවේදනයේ ප්‍රමුඛයා බවට පත් වීම රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ ඉදිරි දැක්මයි.

නවීන තාක්ෂණයත් සමඟ වර්තමානයේ දෛනික කටයුතු සම්ප්‍රදායික කාර්යන්ගෙන් ඔබ්බට ගිය ඩිජිටල් තාක්ෂණයත් සමඟ සියලු කාර්ය ඩිජිටල්කරණයට (Digitalization) ලක්වෙමින් කාර්යයන් වඩාත් පහසුවෙන් සිදු කෙරෙන ඩිජිටල් අවකාශය තුළ රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව ඉදිරියට පියවර තබමින් සිටී.

සියලු මාධ්‍ය ආයතන සමඟ ජාලගත වෙමින් ප්‍රවෘත්ති මූලාශ්‍රය ලෙස රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව කටයුතු කරනු ලබන අතර රජයේ සියලු කාලීන හා සංවර්ධන තොරතුරු රජයේ සහ පෞද්ගලික මුද්‍රිත විද්‍යුත් මාධ්‍ය වෙත ලබාදීමේ රජයේ යාන්ත්‍රණය ක්‍රියාත්මක කරනු ලබයි.

එසේම වර්තමානයේ ඩිජිටල් අවකාශය තුළ ජනතාවට විශ්වසනීය තොරතුරු සපයන්නා බවට කෙරෙන දැවැන්ත අභියෝගය භාර ගනිමින් ජනතාව වෙත තොරතුරු සන්නිවේදනය කිරීමේ ඩිජිටල් වේදිකාව මෙම වසරේ ඉහළ මට්ටමට ගෙන ඒමට හැකිවීම රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව ලැබූ සුවිශේෂී වූ ජයග්‍රහණයකි.

දෙපාර්තමේන්තුව යටතේ පවතින වෙබ් අඩවි, සමාජ මාධ්‍ය ජාලය තුළ වසරක් වැනි කෙටි කාලයක් තුළ සුවිශේෂී ක්‍රියාකාරකම් ගණනාවක් සිදු කරමින් ජනතා කේන්ද්‍රීය තොරතුරු ජාලය නිර්මාණය කිරීමට ද හැකි වී ඇත.

ඩිජිටල්කරණයේ සුවිශේෂී අවස්ථා

සමාජ මාධ්‍ය ජාලය තුළ නොයෙකුත් අවස්ථාවල සාවද්‍ය තොරතුරු සැරිසරන අතර සෑම විටම ජනතාවට ලැබෙන තොරතුරුවල නිරවද්‍යභාවය, විශ්වසනීයත්වය ඇති කිරීම අනිවාර්ය වේ. ඒ වෙනුවෙන් මේ වන විට වැඩි පිරිසක් අතර ප්‍රචලිත සමාජ මාධ්‍ය භාවිත කරමින් විශ්වසනීය තොරතුරු ජනතාව වෙත ඩිජිටල් අවකාශය තුළ ලබාදීමට කටයුතු කිරීම. ඒ අනුව රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව www.dgi.gov.lk, “department of Government Information” YouTube නාලිකාව සහ Face Book පිටුව සහ www.newslk වෙබ් අඩවිය,YouTube නාලිකාව සහ Face Book පිටුව හා Twitter යන සියලු ජාලයන් ඔස්සේ විශ්වසනීය තොරතුරු ජනතාව වෙත සෘජුව සන්නිවේදනය කරනු ලබයි.

රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ ඩිජිටල්කරණයේ සුවිශේෂී ජයග්‍රහණ

	වැඩසටහන	ක්‍රියාත්මක කිරීම
මාධ්‍ය වෙත පහසුකම් සැලසීම		
01	මාධ්‍ය වෙත තොරතුරු ලබාදීම සඳහා cloud අවකාශය භාවිතය	රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව මාධ්‍ය වෙත තොරතුරු ලබාදීමේ මූලාශ්‍රය ලෙස කටයුතු කරනු ලබන අතර එය සාම්ප්‍රදායික ක්‍රමයෙන් ඉදිරියට පිවිස වීඩියෝපට, හඬ පට, ඡායාරූප, ප්‍රවෘත්ති නිවේදන සියල්ල සියලු මාධ්‍ය වෙත එකම මොහොතක් තුළ කඩිනමින් ලබාදීම
02	දෙපාර්තමේන්තුව මඟින් සිදු කරනු ලබන සියලුම මාධ්‍ය ආවරණ මාධ්‍ය වෙත කඩිනමින් නිකුත් කිරීම	රජය මඟින් ක්‍රියාත්මක කරනු ලබන වැඩසටහන් සම්බන්ධයෙන් සිදුකරනු ලබන සියලු මාධ්‍ය ආවරණවල තොරතුරු ඇතුළත් නිවේදනය සහිතව වීඩියෝපට, හඬ පට, ඡායාරූප යනාදී සියල්ල මාධ්‍ය වෙත නිකුත් කිරීම. මෙම ක්‍රමවේදය ආරම්භ කිරීමට පෙර ඒ සඳහා විධිමත් ක්‍රමවේදයක් නොතිබුණු අතර ඒ සියලු කටයුතු මනා සම්බන්ධීකරණයෙන් සියලුම මාධ්‍ය ආයතන අතර මනා සම්බන්ධතාවයකින් ක්‍රියාත්මක කිරීමට හැකි වී තිබීම.
03	ඊමේල් System සකස් කිරීම	මෙරට සියලුම මාධ්‍ය එනම්, මුද්‍රිත, විද්‍යුත්, වෙබ් මාධ්‍ය, නව මාධ්‍ය, විදෙස් මාධ්‍ය ඇතුළු සියලුම මාධ්‍යයන් වෙනුවෙන් 200 ආසන්න ඊමේල් පද්ධතියක් තුළින් තොරතුරු හුවමාරු කිරීම
04	සියලුම මාධ්‍යවේදීන් සඳහා මාධ්‍ය හැඳුනුම්පත නිකුත් කිරීම	ලිපිගොනු ඔස්සේ පවත්වාගෙන ගිය මාධ්‍ය හැඳුනුම්පත් නිකුත් කිරීම වෙනුවට දත්ත පද්ධතියක් (Data Base) සකස් කිරීම හා මාධ්‍යවේදීන් සඳහා සිය වෘත්තීය අභිමානයක් ලබාදීමට කටයුතු කිරීම.
ජනතාව වෙත සෘජුව තොරතුරු ලබාදීම		
	“Department of Government Information” YouTube විකාශය පවත්වාගෙන යාම	Department of Government Information You Tube නාලිකාව 2019 වසරේ ජනවාරී වන විට අක්‍රිය තත්ත්වයේ ජේක්ෂකයින් 12 දෙනෙකු පමණක් සිටි අතර එම වසර අවසන් වන විට 1000කට වැඩි පිරිසක් ඒ සඳහා එක් කර ගැනීමට හැකි විය.එහිදී වීඩියෝ පට විවිධ තේමාවන් ඔස්සේ සකස් කර ඉදිරිපත් කිරීමට කටයුතු කර තිබේ.

		එනම්, INFO News, INFO Highlights, අතුළාන්තය (Inside), INFO News Parliament Highlights, Provincial Highlights, Taller, Documentary, Short video Reel, 2019මැතිවරණයේ නිල ඡන්ද ප්‍රතිඵල සජීවී මැතිවරණ විකාශය නොකඩවා පැය 24ක් එනම්, අවසන් නිල ඡන්ද ප්‍රතිඵලය දක්වා පවත්වාගෙන යාම දෙපාර්තමේන්තුව ලැබූ සුවිශේෂ ජයග්‍රණයක් විය. එම අවස්ථාවේ දෙස් - විදෙස් විශාල ජනතාවක් මෙම YouTube නාලිකාව සමඟ එක්ව සිටි අතර ඉහළ ජනතා ප්‍රසාදයට ද ලක් විය.
	“Department of Government Information”FaceBook පිටුව පවත්වාගෙන යාම	2019 ජනවාරි වන විට මෙම face book පිටුව සමඟ 90,000ක පමණ පිරිසක් එක්ව (like) සිටි අතර එය 20,000ක සංඛ්‍යාවකින් ඉහළ නැංවීමට හැකි විය. අන්තර්ගතය විධිමත් ක්‍රමවේදයක් ඔස්සේ සකස් කිරීමට අවධානය යොමු වූ පසු face book like, people reached, engage සංඛ්‍යාව දිනෙන් දින ඉහළ මට්ටමකට ගෙන ඒමට හැකි විය. මෙහිදී කාලීන හා සංවර්ධන ප්‍රවෘත්ති ඇතුළත් වීඩියෝ පට (You Tube නාලිකාවේ සියලුම වීඩියෝ) නිර්මාණාත්මක post සහ ඡායාරූප කෙටි විස්තරයක් සහිතව මෙහි යාවත්කාලීන කිරීම සිදු වේ. 2019 ජනාධිපතිවරණ නිල ඡන්ද ප්‍රතිඵල විකාශය, නිල ඡන්ද ප්‍රතිඵල සහිත face book post පල කිරීම මෙම පිටුව හරහා ද සිදු වූ අතර ලක්ෂ සංඛ්‍යාත ජනතාවක් මේ වටා එක්ව සිටියහ. මේ වන විට සතියකට ලක්ෂයට වැඩි reachedසංඛ්‍යාවක් පවත්වාගෙන යාමට හැකි වී තිබේ.
	www.news.lk web අඩවිය	කාලීන හා සංවර්ධන සියලුම ප්‍රවෘත්ති මෙම වෙබ් අඩවිය ඔස්සේ යාවත්කාලීන කිරීම භාෂා ත්‍රිත්වයෙන්ම සිදු වන අතර පැය 24 පුරා යාවත්කාලීන වන රජයේ නිල පුවත් වෙබ් අඩවිය වේ. මෙම වෙබ් අඩවිය යටතේ Face book පිටුව, You Tube නාලිකාව, twitter පිටු ක්‍රියාත්මක වේ. 2019 ජනාධිපතිවරණ නිල ඡන්ද ප්‍රතිඵල වෙබ් අඩවියේ යාවත්කාලීන කිරීම, Face book පිටුව, You Tube නාලිකාව ඔස්සේ විකාශය පවත්වා ගෙන යාම සිදු කෙරිණි. එසේම කැබිනට් මාධ්‍ය සාකච්ඡාව ඇතුළු විශේෂ මාධ්‍ය සාකච්ඡා සජීවී විකාශය පවත්වාගෙන යාම මෙම වසර තුළ ආරම්භ කළ අතර ඒ සඳහා ඉහළ ප්‍රතිචාර ලැබෙමින් පවතී.

	දෙසතිය සඟරාව	ජනතාව වෙත කාලීන හා සංවර්ධන මෙන්ම විදෙස් තොරතුරු කැටි කරගත් වසර 43ක ඉතිහාසයකට හිමිකම් කියන දෙසතිය සඟරාව නියමිත පිරිදි, නියමිත දිනට නිකුත් කිරීමට උත්සාහ දරණ ලදි. ඒ රටතුළ පැවති කොවිඩ් - 19 වසංගතය හමුවේ මාස ගණනාවක් ආයතනයේ වැඩ කටයුතු අඩපණ වුවද නිවෙස්වල සිට රාජකාරී ඉටු කරමින් 2020 වර්ෂය තුළ ඉතා ඉහළ නිමාවකින් හා ප්‍රමිතියකින් යුතුව දෙසතිය සඟරා දහයක් (10) මුද්‍රණය කරමිනි. දෙසතිය සඟරාව බෙදාහැරීමේ කටයුතු ලෙක්හවුස් ආයතනයට භාර දෙමින් මුළු ලංකාවම ආවරණය වන විධිමත් බෙදා හැරීමේ ජාලයක් හරහා මෙම සඟරාව පාඨකයන් වෙත ලබා දීමට කටයුතු කර ඇත.
මාධ්‍ය සංරක්ෂිත පද්ධතියක් ක්‍රියාත්මක කිරීම		
	ඩිජිටල් සංරක්ෂිත පද්ධතියක් ස්ථාපිත කිරීම	මෙම දෙපාර්තමේන්තුව සතුව පවතින ඓතිහාසික වැදගත් චිත්‍රපට, වීඩියෝ පට, ඡායාරූප යනාදිය ඩිජිටල් තාක්ෂණයට හැරවීමේ (Convert To Digital) ව්‍යාපෘතියක් ද ආරම්භ කර තිබේ. මේ වන විට පැරණි චිත්‍රපට 100ක් පමණ ඩිජිටල් තාක්ෂණයට convert කර, සංරක්ෂණය කිරීමට කටයුතු යොදා ඇත ඊට අමතරව ඩිජිටල් සංරක්ෂිත පද්ධතිය ස්ථාපිත කිරීමට පසුගිය වසරේ සිදු වූ ප්‍රධාන කාර්යයක් වූ අතර එහි විශේෂිත වූ වීඩියෝ පට, ඡායාරූප සංරක්ෂණය කිරීම එදිනෙදා සිදු කෙරෙන කාර්යයක් බවට මෙම වසර තුළ ද පත් කිරීමට හැකි වීම.

මාධ්‍ය වෙත තොරතුරු ලබාදීමේ පහසුකම් විධිමත් ලෙස පුළුල් කිරීම

යහපත් සාමාජ පැවැත්මක් උදෙසා මාධ්‍ය ක්ෂේත්‍රයේ වගකීම් හා ප්‍රතිපත්ති නිරතුරුවම වැදගත් වන බැවින් විශ්වසනීයත්වයෙන් සත්‍ය තොරතුරු වාර්තාකරණය වෙනුවෙන් මාධ්‍ය ආයතන තොරතුරුවලින් සන්නද්ධ කිරීම කාලීන අවශ්‍යතාවක් වේ. ඒ අනුව රජයේ සංවර්ධන හා කාලීන තොරතුරු විධිමත් ක්‍රමවේදයක් ඔස්සේ මාධ්‍ය වෙත සන්නිවේදනය කිරීමේ වැඩපිළිවෙළක් රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව මඟින් ක්‍රියාත්මක කිරීම සඳහා කටයුතු යොදා ඇත. ඒ අනුව Cloud තාක්ෂණය භාවිත කරමින් ඒ ඔස්සේ මාධ්‍ය ආයතන වෙත වීඩියෝ පට, ඡායාරූප, මාධ්‍ය නිවේදන යන සියල්ල කඩිනමින් ලබා දීමේ විධිමත් ක්‍රමවේදය ආරම්භ කර තිබේ.

විශේෂ ජයග්‍රහණ,

අතිගරු ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මැතිතුමාගේ ''සෞභාග්‍යයේ දැක්ම'' ප්‍රතිපත්ති ප්‍රකාශයට අනුව දියුණු, ගුණාත්මක ජනමාධ්‍ය සංස්කෘතියක් බිහි කිරීම උදෙසා මෙම දෙපාර්තමේන්තුවේ ජනමාධ්‍ය පර්යේෂණ විෂය යටතේ 2020 වර්ෂයේ කටයුතු සිදු කර ඇත.

1. වෘත්තීය ජනමාධ්‍ය විෂය පුළුල් කිරීම, ජනමාධ්‍ය අධ්‍යාපනය දියුණු කිරීම හා ජනමාධ්‍යවේදීන්ගේ වෘත්තීය දැනුම, කුසලතා සහ ආකල්ප සංවර්ධනය කිරීම සඳහා වෘත්තීය මට්ටමේ ජනමාධ්‍ය ශාස්ත්‍රීය කෘතිය එනම්, ජනමාධ්‍ය සංකථන කෘතිය එළි දැක්වීම

2. ගුණාත්මක වෘත්තීය ජනමාධ්‍ය සංස්කෘතියක් බිහි කිරීම සඳහා විශ්වවිද්‍යාල ජනමාධ්‍ය අධ්‍යයන අංශ ඒකාබද්ධව ශ්‍රී ලාංකේය ජනමාධ්‍ය ක්ෂේත්‍රයේ ඉදිරි ගමන් මඟ කෙසේ සකස් විය යුතු ද යන්න පිළිබඳව ශාස්ත්‍රීය දැනුම හුවමාරු කිරීම හා වර්තමානයේ ශ්‍රී ලංකාවේ ජනමාධ්‍ය ක්ෂේත්‍රයේ පැන නැඟී ඇති ගැටළු පිළිබඳව සාකච්ඡා කිරීම හා එම තොරතුරු රජය වෙත ලබා දීම

3. රාජ්‍ය මාධ්‍ය ආයතනවල ජනමාධ්‍ය පර්යේෂණ අංශ හා ඒකාබද්ධව වර්තමානයේ ජනමාධ්‍ය ක්ෂේත්‍රයේ පැන නැඟී ඇති සමාජීය ගැටළු, ජනමාධ්‍ය සංස්කෘතියේ බලපෑම හා මාධ්‍ය හැසිරීම පිළිබඳව සාකච්ඡා කිරීම හා එම තොරතුරු අවශ්‍ය කටයුතු සඳහා රාජ්‍ය මාධ්‍ය ආයතන ප්‍රධානීන් මඟින් දැනුවත් කිරීම

4. ශ්‍රී ලංකාවේ ජනමාධ්‍ය ක්ෂේත්‍රයේ ඉදිරි දිසානතිය තීරණය කිරීම සඳහා විශ්වවිද්‍යාල ආචාර්යවරුන්, ජනමත නායකයින්, සිවිල් සංවිධාන හා පුරවැසියන්ගේ අදහස් ලබා ගැනීම හා එම අදහස් පිළිබඳ රජයේ අවධානය සඳහා යොමු කිරීම

5. යහපත්, ගුණාත්මක ජනමාධ්‍ය සංස්කෘතියක් බිහි කිරීම උදෙසා ''සෞභාග්‍යයේ දැක්ම'' ප්‍රතිපත්ති ප්‍රකාශයට අනුව ජනමාධ්‍ය අධ්‍යාපනය පාසල් මට්ටමින් දියුණු කිරීම සඳහා පාසල් ජනමාධ්‍ය විෂය උගන්වන ගුරුවරුන්ගේ දැනුම, කුසලතා හා ආකල්ප සංවර්ධනය කිරීම හා එම තොරතුරු පද්ධතියක් පවත්වාගෙන යාම,

ඒ යටතේ,

- පාසල් ජනමාධ්‍ය සමාජ වැඩසටහන ප්‍රවර්ධනය කිරීම
- පාසල් ජනමාධ්‍ය සමාජ ලියාපදිංචි කිරීම
- පාසල් ජනමාධ්‍ය ඒකක සඳහා බිත්ති පුවත්පත් 100ක් ලබා දීම
- පාසල් ජනමාධ්‍ය විෂය උගන්වන ගුරුවරුන්ට රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ මාධ්‍ය හැඳුනුම්පත් ලබා දීම සහ තොරතුරු ඒකරාශි කිරීම

6. ජනමාධ්‍ය වෘත්තීය අධ්‍යාපනය හා ජනමාධ්‍යවේදීන් පුහුණු කිරීමේ වැඩසටහන යටතේ,

- ත්‍රිවිධ හමුදා හා පොලිස් මාධ්‍ය ඒකකවල වෘත්තීය ජනමාධ්‍ය නිලධාරීන් ලෙස කටයුතු කරන නිලධාරීන්ට ප්‍රායෝගික ජනමාධ්‍ය දැනුම ලබා දීම (එක් වැඩසටහනක් දැනට ක්‍රියාත්මක කර ඇත)

7. සෞභාග්‍යයේ දැක්ම යටතේ දියුණු සංස්කෘතික මිනිසෙක් බිහි කිරීම සඳහා ජනමාධ්‍ය සතු සමාජ වගකීම යටතේ මාසිකව පවත්වනු ලබන චිත්‍රපට රසවින්දන වැඩසටහන් මාලාවක් පැවැත්වීම (කොවිඩ් - 19 වසංගත තත්වය හමුවේ 2020 වර්ෂය සඳහා වැඩසටහන් තුනක් පමණක් පවත්වා ඇත)

8. සමාජ මාධ්‍ය ප්‍රවනතා හඳුනා ගනිමින් ඒ ඔස්සේ වෙබ් අඩවි යාවත්කාලීන කිරීම, ප්‍රවෘත්ති සම්පාදනය කිරීම, සමාජ මාධ්‍ය ජාල සක්‍රීය ලෙස පවත්වාගෙන යාම සිදු කිරීම


9. නව මාධ්‍ය ඔස්සේ මැතිවරණ සජීවී විකාශ කටයුතු සිදු කිරීම හා කැබිනට් මාධ්‍ය හමුව ඇතුළු විශේෂ මාධ්‍ය සාකච්ඡා සමාජ මාධ්‍ය ඔස්සේ සජීවී ලෙස විසුරුවා හැරීම

10. කාලයක් අක්‍රීයව පැවති රජයේ නිල ජංගම කෙටි පුවත් සේවය යළි සක්‍රීය කොට සිංහල හා ඉංග්‍රීසි යන භාෂාවලින් පවත්වා ගෙන යාම ආරම්භ කිරීම

අභියෝග හා ඉදිරි ඉලක්ක

රාජ්‍ය ප්‍රතිපත්ති, රජයේ සංවර්ධන ක්‍රියාදාමය ඇතුළුව ජාතික වැදගත්කමකින් යුතු කාලීන ක්‍රියාකාරකම් සහ ජනතාව වෙනුවෙන් රජය මඟින් ඉටු කරනු ලබන කාර්යභාරය පිළිබඳව මහජනතාව දැනුවත් කිරීම මෙම දෙපාර්තමේන්තුවේ ප්‍රධාන වගකීම හා කාර්යභාරය වේ. එසේම ගෝලීය තාක්ෂණ ප්‍රවණතාවන්වලට අනුගත වෙමින් තොරතුරු තාක්ෂණ ක්‍රියාවලිය කළමනාකරණය කර, නිදහස් හා වගකිව යුතු උසස් මාධ්‍ය සංස්කෘතියක් ගොඩනැඟීම සඳහා අනුබල දීම හා නායකත්වය සැපයීම ප්‍රධාන අභිමතාර්ථයන් වේ.

රජයේ ඉලක්කය වන ‘‘සෞභාග්‍යයේ දැක්ම’’ ප්‍රතිපත්ති ප්‍රකාශයේ අරමුණු ඉටු කර ගැනීම සඳහා ජනතාව දැනුවත් කිරීම සමාජ මාධ්‍ය හා වෙබ් අඩවි ඔස්සේ පුළුල්ව සිදු කිරීම තුළින් ජනතාව නිවැරදි තොරතුරුවලින් හා දැනුමින් සන්නද්ධ කරලීම උදෙසා ජනමාධ්‍ය වෙත පැවරී ඇති වගකීම ඉටු කිරීම සඳහා වූ පැහැදිලි ජනමාධ්‍ය ප්‍රතිපත්තියක් සමාජය තුළ ස්ථාපිත කිරීමට පෙරමුණ ගෙන ක්‍රියා කිරීමට 2021 වර්ෂයේදී මූලික වශයෙන් අපේක්ෂිතය.



නාලක කලුවැව

රජයේ ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජනරාල් / ගණන් දීමේ නිලධාරී

03
පරිච්ඡේදය

2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා වන සමස්ත මූල්‍ය කාර්ය සාධනය

2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා වන සමස්ත මූල්‍ය කාර්ය සාධනය

3.1 මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය

එස්සීඒ - එල්

2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ කාල සීමාව සඳහා වන මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය

රු.

අයවැය 2020		සටහන	2020	තක්‍ෂ 2019	
-	**ආදායම් ලැබීම්**				
-	ආදායම් බදු	1	-	-	
-	දේශීය භාණ්ඩ හා සේවා මත බදු	2	-	-	
-	ජාත්‍යන්තර වෙළඳාම මත බදු	3	-	-	ඒසිඒ-1
-	බදු නොවන ආදායම් හා වෙනත්	4	-	-	
-	**මුළු ආදායම් ලැබීම් (අ)**		-	-	
-	**ආදායම් නොවන ලැබීම්**				
-	භාණ්ඩාගාර අග්‍රිම		236,775,000	310,930,000	ඒසිඒ-3
-	තැන්පතු		20,959,326	1,302,547	ඒසිඒ-4
-	අත්තිකාරම් ගිණුම්		6,794,343	12,517,778	ඒසිඒ-5
-	වෙනත් ලැබීම්		20,989,638	21,131,019	
-	**මුළු ආදායම් නොවන ලැබීම් (ආ)**		**285,518,307**	**345,881,344**	
-	**මුළු ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඇ = (අ) + (ආ)**		**285,518,307**	**345,881,344**	
	අඩු කළා : වියදම්				
-	**පුනරාවර්තන වියදම්**				
156,369,160	වැටුප්, වේතන සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ	5	155,804,392	133,366,714	

83,420,500	අනෙකුත් භාණ්ඩ හා සේවා	6	81,077,889	118,544,529	ඒසිඒ-2(ii)
1,722,200	සහනාධාර, ප්‍රදාන සහ මාරු කිරීම්	7	1,717,002	1,723,193	
-	පොළී ගෙවීම්	8	-	-	
15,300	වෙනත් පුනරාවර්තන වියදම්	9	15,300	-	
241,527,160	**මුළු පුනරාවර්තන වියදම් (ඈ)**		**238,614,583**	**253,634,436**	
	මූලධන වියදම්				
21,644,000	මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩි දියුණු කිරීම	10	20,432,358	15,774,039	
5,751,000	මූලධන වත්කම් අත්පත් කර ගැනීම්	11	5,743,484	45,571,377	
-	ප්‍රාග්ධන මාරු කිරීම්	12	-	-	ඒසිඒ-2(ii)
-	මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම	13	-	-	
515,000	හැකියා වර්ධනය	14	511,194	1,483,407	
-	වෙනත් මූලධන වියදම්	15	-	-	
27,910,000	**මුළු මූලධන වියදම් (ඉ)**		**26,687,036**	**62,828,823**	
-	ප්‍රධාන ලෙජර් වියදම් (ඊ)		**28,547,229**	**13,627,757**	
-	තැන්පතු ගෙවීම්		21,300,737	572,382	ඒසිඒ-4
-	අත්තිකාරම් ගෙවීම්		7,246,492	13,055,375	ඒසිඒ-5
-	මුළු වියදම් උ = (ඈ+ඉ+ඊ)		293,848,848	330,091,016	
-	2020 දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය ඌ = (ඇ-උ)		**(8,330,541)**	**15,790,328**	

3.3 මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශය

ඒසීඒ-පී

2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

		තක්ෂ	
	සටහන	2020 (රු.)	2019 (රු.)
මූල්‍ය නොවන වත්කම්			
දේපළ, පිරියත හා උපකරණ	ඒසීඒ-6	1,768,395,028	1,762,938,741
මූල්‍ය වත්කම්			
අත්තිකාරම් ගිණුම්	ඒසීඒ-5/5(ඒ)	37,015,148	36,964,465
මුදල් හා මුදල් සමාන දෑ	ඒසීඒ-3	-	168,073
මුළු වත්කම්		**1,805,410,176**	**1,800,071,279**
ශුද්ධ වත්කම් / ස්කන්ධය			
ශුද්ධ වත්කම්		28,425,236	28,033,141
දේපළ පිරියත හා උපකරණ සංචිතය		1,768,395,028	1,762,938,741
කුලී හා වැඩ අත්තිකාරම් සංචිතය	ඒසීඒ-5(බී)	-	-
ජංගම වගකීම්			
තැන්පතු ගිණුම	ඒසීඒ-4	8,589,912	8,931,324
අග්‍රිම ශේෂය	ඒසීඒ-3	-	168,073
මුළු වගකීම්		**1,805,410,176**	**1,800,071,279**

පිටු අංක 06 සිට 69 දක්වා ඒසීඒ 1 සිට ඒසීඒ 6 දක්වා වූ ආකෘති පත්‍රවලින් ඉදිරිපත් කෙරෙන ගිණුම් තොරතුරු සහ සටහන් පිටු අංක 70 සිට 88 දක්වා ඇතුළත් ගිණුම් සටහන් විස්තර ද මෙම අවසන් ගිණුමෙහිම අන්තර්ගත කොටස් වේ. මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පොදුවේ පිළිගත් ගිණුම් මූලධර්මවලට අනුකූලව සිදුකර ඇති අතර මෙහිදී මූල්‍ය ප්‍රකාශයන්හි සටහන් මගින් හෙළදිරව් කර ඇති පරිදි වඩාත් සුදුසු ගිණුම්කරණ ප්‍රතිපත්ති භාවිතා කර ඇත. ඉහත අවසන් ගිණුමෙහි සඳහන් සංඛ්‍යා, ඊට අදාළ ගිණුම් සැසඳීම් හා අනෙකුත් ගිණුම් තොරතුරු, භාණ්ඩාගාර ගිණුම් පොත් සමඟ සැසඳීම් කර ඇති බවටත් ඒවා එම සංඛ්‍යා සමඟ එකඟ වන බවටත් මෙයින් සහතික කරමු.

.....	.....	.....
ප්‍රධාන ගණන්දීමේ නිලධාරී	ගණන්දීමේ නිලධාරී	ප්‍රධාන ගණකාධිකාරී
නම : ජගත් පී. විජේවීර	නම : මාලක කලුවැව	නම : එච්.ඒ.යූ. ජයලත්
තනතුර : ලේකම්, ජනමාධ්‍ය අමාත්‍යාංශය	තනතුර : ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජනරාල්	දිනය : 2021.02.22
දිනය : 2021.02.23	දිනය : 2021.02.22	එච්. ඒ. යූ. ජයලත්
ජගත් පී. විජේවීර	මාලක කලුවැව	ප්‍රධාන ගණකාධිකාරී
ලේකම්	රජයේ ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජනරාල්	රජය ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව
ජනමාධ්‍ය අමාත්‍යාංශය	රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව	163, කිරුළපන මාවත,
ඇසිඩිසි මැදුර, නො. 163, ඇල්විටිගල මාවත		පොළුවිල 05.
පොල්හේන්ගොඩ, කොළඹ - 05		

3.4 මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය

ඒසිඒ-සී

2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් කාල වර්ෂය සඳහා වන මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය

	තක්ෂ	
	2020 (රු.)	**2019 (රු.)**
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
මුළු බදු ලැබීම්	-	-
ගාස්තු, අධිභාර, දඩ මුදල් සහ බලපත්‍ර	-	-
ලාභ	-	-
ආදායම් නොවන ලැබීම්	-	281,860
වෙනත් ශීර්ෂ වෙනුවෙන් එකතු කරන ලද ආදායම්	20,989,638	13,885,179
අග්‍රිම ලැබීම්	236,775,000	310,930,000
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (අ)	**257,764,638**	**325,097,039**
අඩු කළා - මුදල් වැය කිරීම්		
පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම්	230,036,891	230,937,450
සහනාධාර සහ මාරු කිරීම් වියදම්	1,717,002	1,723,193
වෙනත් වැය ශීර්ෂ වෙනුවෙන් දරන ලද වියදම්	6,827,049	18,792,295
භාණ්ඩාගාරයට පියවන ලද අග්‍රිම	-	-
මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය (ආ)	**238,580,942**	**251,452,938**
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය	**19,183,696**	**73,644,101**
ඇ = (අ)– (ආ)		
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
පොළී	-	-
ලාභාංශ	-	-
භිමිකම් ඉවත් වීමේ ප්‍රතිපාදන හා භෞතික වත්කම් විකිණීම	-	-
උපණය අය කර ගැනීම	-	-

අත්තිකාරම් අය කර ගැනීම	6,779,043	452,413
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඇ)	**6,779,043**	**452,413**
අඩු කළා - මුදල් වැය කිරීම් :		
භෞතික වත්කම් ඉදිකිරීම් හෝ මිලදී ගැනීම් හා වෙනත්	24,002,183	62,281,390
ආයෝජන අත්පත් කර ගැනීම්		
අත්තිකාරම් ගෙවීම්	1,787,218	11,331,894
ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය(ඉ)	**25,789,401**	**73,613,284**
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඊ) = (ඇ) + (ඉ)	**(19,010,358)**	**(73,160,871)**
මෙහෙයුම් හා ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය(උ) = (ඇ) + (ඊ)	**173,338**	**483,230**
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
දේශීය ණය ගැනීම්	-	-
විදේශීය ණය ගැනීම්	-	-
ප්‍රදානයන් ලැබීම්	-	-
තැන්පතු ලැබීම්	20,959,326	257,225
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුළු මුදල් ප්‍රවාහය (ඌ)	**20,959,326**	**257,225**
අඩු කළා - මුදල් වැය කිරීම් :		
දේශීය ණය ආපසු ගෙවීම්	-	-
විදේශීය ණය ආපසු ගෙවීම්	-	-
තැන්පතු ගෙවීම්	21,300,737	572,382
මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (එ)	**21,300,717**	**572,382**
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඒ)= (ඌ)–(එ)	**(341,411)**	**(315,157)**
මුදල්වල ශුද්ධ වෙනස් වීම් (ඔ) = (උ) – (ඒ)	**(168,073)**	**168,073**
ජනවාරි 01 දිනට ආරම්භක මුදල් ශේෂය	**168,073**	**-**
දෙසැම්බර් 31 දිනට අවසාන මුදල් ශේෂය	**(0)**	**168,073**

3.5 මූල්‍ය ප්‍රකාශ සටහන්

වාර්තා කිරීමේ පදනම

(1). වාර්තාකරණ කාල පරිච්ඡේදය

2020 ජනවාරි 01 සිට දෙසැම්බර් 31 දක්වා වූ කාල පරිච්ඡේදය මෙම මූල්‍ය ප්‍රකාශයන්ට අදාළ වාර්තාකරණ කාල පරිච්ඡේදය වේ.

(2). මිනුම්කරණ පදනම

මූල්‍ය ප්‍රකාශන ඓතිහාසික පිරිවැය මත පිළියෙළ කර ඇති අතර සමහර වත්කම්වල ඓතිහාසික පිරිවැය නැවත තක්සේරු කරන ලද වටිනාකමට වැඩිදියුණු කර ඇත. අන්‍යාකාරයෙන් දක්වා නොමැති විට ගිණුම් පිළියෙළ කිරීම වැඩිදියුණු කළ මුදල් පදනම මත සිදු කරයි.

මූල්‍ය ප්‍රකාශ ශ්‍රී ලංකා රුපියල්වලින් ආසන්නතම රුපියලට ඉදිරිපත් කර ඇත.

(3). ආදායම් හඳුනා ගැනීම

හුවමාරු හා හුවමාරු නොවන ආදායම් ඒවා ලැබිය යුතු කාල සීමාව නොසළකා, මුදල් ලැබෙන කාල පරිච්ඡේදයේදී ආදායම් ලෙස හඳුනාගනු ලැබේ.

(4). දේපළ, පිරියත හා උපකරණ හඳුනාගැනීම හා මැනීම

වත්කමට අදාළ අනාගත ආර්ථික ප්‍රතිලාභ ආයතනයට ලැබෙන බවට තහවුරුවක් ඇති විට හා එම වත්කම් විශ්වාසනීයව මැනිය හැකි නම්, එම වත්කම්, දේපළ, පිරියත හා උපකරණ ලෙස හඳුනාගනු ලැබේ.

දේපළ, පිරියත හා උපකරණ පිරිවැයට හඳුනා ගන්නා අතර පිරිවැය ආකෘතිය අදාළ නොවන අවස්ථාවලදී නැවත තක්සේරු කරන ලද අගය යොදා ගනී.

(5). දේපළ, පිරියත හා උපකරණ සංචිතය

මෙම සංචිත ගිණුම දේපළ, පිරියත හා උපකරණවල අනුරූප ගිණුම් වේ.

(6). මුදල් හා මුදල් සමාන දෑ

2020 දෙසැම්බර් 31 දිනට අතැති දේශීය ව්‍යාවහාර මුදල් නෝට්ටු සහ කාසිවලින් මුදල් හා මුදල් සමාන දෑ සමන්විත වේ.

3.6 ආදායම් එකතු කිරීමේ කාර්ය සාධනය

රු. ,000

ආදායම් ක්ෂේත්‍රය	ආදායම් ක්ෂේත්‍රයේ විස්තරය	ආදායම් ඇස්තමේන්තුව		එකතු කරන ලද ආදායම	
		මුදල් ඇස්තමේන්තුව	අවසන් ඇස්තමේන්තුව	ප්‍රමාණය (රු.)	අවසාන ආදායම් ඇස්තමේන්තුවේ % ලෙස
20.06.02.01	වාහන	-	-	-	-
20.06.02.02	අනෙකුත්	-	-	-	-
20.02.01.01	රජයේ ගොඩනැගිලි හා නිවාස කුලී	-	37.2	21.7	58.33
20.02.01.99	රජයේ වත්කම්වලින් ලැබෙන ආදායම - කුලී - අනෙකුත් කුලී	-	-	-	-
20.02.02.99	පොළිය - අනෙකුත්	1,000	700	1,423.5	203.36
20.03.01.00	විකුණුම් හා ගාස්තු - දෙපාර්තමේන්තුමය විකිණීම්	1,200	600	1,169.8	194.97
20.03.02.99	විකුණුම් හා ගාස්තු - පරිපාලනාත්මක ගාස්තු හා ගෙවීම් විවිධ	-	7	7	100
20.03.03.02	විකුණුම් හා ගාස්තු - දඩ මුදල් හා රාජසන්තක කිරීම් - අනෙකුත්	-	-	-	-
20.03.99.00	විකුණුම් හා ගාස්තු - අනෙකුත් ලැබීම්	900	150	414.14	276.09
20.05.99.00	වර්තන පැවරීම, ජාතික ලොතරැයි මණ්ඩලය හා අනෙකුත් පැවරුම්	-	-	-	-

3.7 වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්ය සාධනය

රු. ,000

ප්‍රතිපාදන වර්ගය	වෙන් කරන ලද ප්‍රතිපාදන		තත්‍ය වියදම	උපයෝගී කරනු ලැබූ ප්‍රතිපාදන, අවසන් කරන ලද අවසාන ප්‍රතිපාදන ප්‍රමාණයේ % ලෙස
	මුදල් ප්‍රතිපාදනය	අවසාන ප්‍රතිපාදනය		
පුනරාවර්තන	රු.240,222,000	රු.241,527,160	රු.238,614,583	98.79
ප්‍රාග්ධන	රු. 27,066,000	රු. 27,910,000	රු. 26,687,035	95.62

3.8 මු.රෙ.208 ප්‍රකාරව, වෙනත් අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තුවල නියෝජිතයෙකු ලෙස මෙම දෙපාර්තමේන්තුවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන

රු. ,000

අනු අංකය	ප්‍රතිපාදන ලද අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව	ප්‍රතිපාදනයේ අරමුණ	ප්‍රතිපාදන		තත්‍ය වියදම	උපයෝගි කර ගන්නා ලද ප්‍රතිපාදන, ලබා දුන් අවසාන ප්‍රතිපාදනවල % ලෙස
			මුල් ප්‍රතිපාදන	අවසාන ප්‍රතිපාදනය		
01.	ජනමාධ්‍ය අමාත්‍යාංශය	වරිපනම් බද්ධ ගෙවීමට	-	560,844.00	560,844.00	100
		අමාත්‍යාංශ බදු අංශය දෙපාර්තමේන්තු ගොඩනැලිල්ලේ පවත්වාගෙන යාම		111,974.02	111,923.35	100

		සඳහා විදුලි බිලෙන් 3%ක් ගෙවීමට				
		ජාතික මාධ්‍ය මධ්‍යස්ථානයෙන් අනුයුක්ත කළ නිලධාරීන්ගේ වැටුප් හා දීමනා ගෙවීම		1,426,000.00	1,426,000.00	100
02.	රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව	ඔවුන්ගේ මුද්‍රණ අංශය දෙපාර්තමේන්තු ගොඩනැගිල්ලේ පවත්වාගෙන යාම සඳහා විදුලි බිලෙන් 25%ක් ගෙවීමට		932,750.21	932,694.58	100
03.	මැතිවරණ කොමිසම	මැතිවරණ රාජකාරී අතිකාල හා ගමන් වියදම් ගෙවීමට	-	987,383.15	575,245.52	58
04.	ආරක්ෂක අමාත්‍යාංශය	ජාතික මාධ්‍ය මධ්‍යස්ථානයෙන් දෙපාර්තමේන්තුවට අනුයුක්ත කළ නිලධාරීන්ගේ වැටුප් හා දීමනා ගෙවීම	-	5,369,500.29	3,220,341.00	60
				9,388,451.67	**6,827,048.45**	**73**

3.9 මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය

රු. ,000

වත්කම් කේතය	කේත විස්තරය	31.12.2019 දිනට භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව ශේෂය	31.12.2019 දිනට මූල්‍ය තත්ත්ව වාර්තාව අනුව ශේෂය	ඉදිරියේදී ගිණුම්කරණයට නියමිත	ප්‍රගතිය % ලෙස වාර්තා කිරීම
9151	ගොඩනැගිලි හා ව්‍යුහයන්	-	300,848,000.00	-	100%
9152	යන්ත්‍රෝපකරණ		236,797,025.43	-	100%
9153	ඉඩම්		1,227,750,000.00	-	100%
9154	අස්පෘශ්‍ය වත්කම්		-	-	100%
9155	ජීව විද්‍යාත්මක වත්කම්		-	-	100%
9160	කෙරීගෙන යන වැඩ		3,000,000.00	-	100%
9180	බදු දෙන ලද වත්කම්		-	-	100%

3.10 විගණකාධිපතිවරයාගේ වාර්තාව

**. පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමේදී, විගණකාධිපතිවරයා විසින් නිකුත් කරන ලද අවසාන විගණන වාර්තාව පරිලෝකනය කර, (SCAN) කොට මෙහි අන්තර්ගත කළ යුතුය.

ශීර්ෂය 210 - රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2021 ජූලි 30 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2021 ජූලි 30 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2020 දෙසැම්බර් 31 දිනට රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වාගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම්කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීමෙන්,

චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදි.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදි.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බව,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.6.1 **ගිණුම්කරණ අඩුපාඩු**

මූලධන වියදම්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයෙහි සමාලෝචිත වර්ෂයේදී මූලධන වත්කම් අත්පත් කරගැනීම සඳහා රු.5,743,484 ක් වැයකර තිබුණ ද, මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශයේ මිලදී ගැනීම් ලෙස රු.4,842,327 ක් ඇතුළත් කර තිබුණි. ඒ අනුව රු.901,157 ක වෙනසක් නිරීක්ෂණය විය.	සමාලෝචිත වර්ෂයේදී මූලධන වත්කම් අත්පත් කර ගැනීම සඳහා රු. 5,743,484 ක් වැයකර තිබුණද, මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශයේ මිලදී ගැනීම් ලෙස ඇතුලත් කර ඇත්තේ රු. 4,842,327.33 ක වත්කම් පමණි. දිස්ත්‍රික් ලේකම් කාර්යාල මගින් මිලදී ගනු ලබන වත්කම් සිගාස් ගිණුම වෙත මිලදී ගැනීමක් ලෙස ඇතුලත් කිරීමට ක්‍රමවේදයක් නොතිබීම හා මිලදී ගැනීම් කිහිපයක් 4ජ'නල් ගතකිරීමේදී අතපසුවී තිබීමද, වායුසමීකරණයක් 2019 වසරේ ඉන්වෙන්ට්‍රිගත කිරීම නිසා එය ආරම්භක ශේෂයට ගෙන ඇති බැවින්ද මෙම වෙනස ඇතිවී තිබුණි.	වැය ලෙජරයන් හා මූල්‍ය ප්‍රකාශයේ අගයන් එකිනෙක ගැලෙපන පරිදි නිවැරදි අගය භාවිතා කර මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතුය.
(ආ)	භෞතික වත්කම් ඉදිකිරීම හෝ මිලදී ගැනීම හා වෙනත් ආයෝජන අත්කර ගැනීම් සඳහා මුදල් වැය කිරීම් තුළ මූලධන වත්කම් පුනරුත්ථාපනයට සහ කාර්ය මණ්ඩල පුහුණුව සඳහා දැරූ රු.18,550,399 ක වියදම් ද ඇතුළත් කර	මූලධන වත්කම් පුනරුත්ථාපනයට හා කාර්ය මණ්ඩල පුහුණුව සඳහා දරන ලද වියදම් මුදල් ප්‍රවාහ ප්‍රකාශය තුල පෙන්නුම් කිරීමට අයිතමයක් නොමැති බැවින් මූලධන වත්කම් පුනරුත්ථාපනය හා කාර්ය මණ්ඩල පුහුණුව, භෞතික වත්කම් ඉදිකිරීම හෝ මිලදී ගැනීම හා වෙනත් ආයෝජන අත්කර ගැනීමක් ලෙස සලකා මුදල් ප්‍රවාහ ප්‍රකාශයට ඇතුළත් කර ඇත. එබැවින් ආයෝජන ක්‍රියාකාරකම් වලින්	මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී නිවැරදි අගයන් ඇතුලත් කළ යුතුය.

	තිබූ බැවින් ආයෝජන ක්‍රියාකාරකම් වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය සහ මෙහෙයුම් හා ආයෝජන ක්‍රියාකාරකම් වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය පිළිවෙලින් එම වටිනාකමින් වැඩියෙන් හා අඩුවෙන් දක්වා තිබුණි.	ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය සහ මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය පිලිවෙලින් රු.18,550,399 ක් අඩුවෙන් හා වැඩියෙන් පෙන්නුම් කරයි.	
(ඇ)	රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුමේ දෙපාර්තමේන්තු පොත් හා භාණ්ඩාගාර පරිගණක මුද්‍රිත අතර වර්ෂය තුළ ලැබීම්, ගෙවීම් හා හර ශේෂ සීමාව අතර වෙනස්කම් දක්නට ලැබුණු අතර ඒ පිළිබඳ සැසඳුම් ප්‍රකාශයේ හෙළිදරව් කර නොතිබුණි.	වෙනත් ආයතනයක් මගින් අප වෙත පවරනු ලබන ණය ශේෂයන් අපගේ මාසික ගිණුම් සාරාංශයන්හි සටහන් නොවන නමුත් අපගේ ණය ගැති හා ණය හිමි ලේඛනයෙහි එය සටහන්ව ඇත. විගණන විමසුමෙහි වර්ෂය තුළ හර කිරීම්වල වෙනස ලෙස සටහන්ව ඇත්තේ එම රු.2,038,544.00 ක මුදලයි. ශේෂ පිරික්සුමෙහි සටහන්ව ඇති අප ආයතනය වෙත බැර කරන ලද ණය ශේෂයන්හි මෙන්ම වෙනත් ආයතන වෙත බැර කරන ලද ණය ශේෂයන්හි එකතුව වන රු. 12,253,618.00ක මුදල විගණන විමසුමෙහි දෙපාර්තමේන්තු පොත් අනුව වර්ෂය තුළ බැර කිරීම් ලෙස සටහන් කර ඇත. උපරිම හර ශේෂ සීමාවෙහි වෙනස ලෙස විගණන විමසුමෙහි සටහන් කර ඇත්තේ ඉහත වර්ෂය තුළ හර කිරීම් සහ වර්ෂය තුළ බැර කිරීම්වල වෙනස්කම්වල එකතුවයි.	වෙනස්කම් සැසඳුම් ප්‍රකාශයේ නිවැරදිව හෙළිදරව් කළ යුතුය.

2. මූල්‍ය සමාලෝචනය

2.1 වියදම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ) පුනරාවර්තන වැය විෂයයන් 2 ක් සඳහා පරිපූරකයක් මගින් ප්‍රතිපාදන රු.2,149,160ක් මාරු කරගෙන තිබුණු අතර නැවත එම වැය විෂයයන්ගෙන් වෙනත් පුනරාවර්තන වැය විෂයයන් වලට රු.6,385,000ක් මු.රෙ.66 මගින් මාරුකර තිබුණි	දෙපාර්තමේන්තුවේ 2020 වර්ෂයේ වියදම් අනුව වැය විෂයන්වල ඉතිරි වීම් පැවති බැවින් මු:රෙ 66 මගින් රු.6,385,000.00 ක් මාරු කර ඇත. ආරක්ෂක අමාත්‍යාංශය විසින් කළ ඉල්ලීමක් අනුව මහා භාණ්ඩාගාරය විසින් රු.2,149,160.00 ක ප්‍රතිපාදන ලබා දුන් බැවින් එම ප්‍රමාණය ආරක්ෂක අමාත්‍යාංශයේ වැය ශීර්ෂයන්ට බැර කර අප දෙපාර්තමේන්තු වැය ශීර්ෂවලට හර කරන ලදී.	මුදල් රෙගුලාසි 50 ප්‍රකාරව නිවැරදි වියදම් ඇස්තමේන්තු පිළියෙල කළ යුතු වීම.
(ආ) මූලධන වැය විෂයයන් 04ක හා පුනරාවර්තන වැය විෂයයන් 09ක ඇස්තමේන්තු ප්‍රතිපාදනයෙන් සියයට 43 සිට සියයට 209 දක්වා මු.රෙ.66 මාරු කිරීම් මගින් ප්‍රතිපාදන මාරුකරගෙන තිබීම හේතුවෙන් ඇස්තමේන්තු සකස් කිරීමේ දුර්වලතාවයක් නිරීක්ෂණය විය.	2020 වර්ෂයේ අයවැය ඇස්තමේන්තු සකස් කරනුයේ 2019 ජුනි මසදී ඒ වන විට පැවති තත්වය සැලකිල්ලට ගනිමිනි. නමුත් 2020 වර්ෂයේ අයවැය ප්‍රතිපාදන පරිපූරක ඇස්තමේන්තු 4කින් ලබාදුන් අතර ඇතැම් වැය ශීර්ෂවලට ඇස්තමේන්තුගත ප්‍රමාණයට වඩා අඩුවෙන් ප්‍රතිපාදන ලැබී	මු.රෙ 50 පරිදි නිවැරදි ඇස්තමේන්තු පිළියෙල කළ යුතුය.

	තිබුණි. තවද ඒ වන විට රටතුළ පැවති වාතාවරණය අනුවද ඇස්තමේන්තු කළ ප්‍රමාණයන්ට වඩා වෙනස් වීම් සිදුවී ඇත.	

2.2 බැරකම් හා බැදීම්වලට එළඹීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	මුදල් රෙගුලාසි 94(1) ප්‍රකාරව බැරකම් හා බැදීම්වලට එළඹීමේදී කිසිම විටෙක මුදල් වර්ෂය සඳහා ඇති ප්‍රතිපාදන නොඉක්මවිය යුතු නමුත් වැය විෂයන් 08 ක එකතුව රු.2,308,508 කින් ප්‍රතිපාදන ඉක්මවා බැරකම්වලට එළඹ තිබුණි.	2020 වර්ෂයේ අයවැය ප්‍රතිපාදන පරිපූරක ඇස්තමේන්තු 4ක් යටතේ ලබාදුන් අතර ඇතැම් වැය ශීර්ෂවලට ඇස්තමේන්තුගත ප්‍රමාණයට වඩා අඩුවෙන් ප්‍රතිපාදන ලැබී තිබුණි. තවද ඒ වන විට රටතුළ පැවති වාතාවරණය අනුව කටයුතු කිරීමට සිදුවූ බැවින් ප්‍රතිපාදන ඉක්මවා බැරකම්වලට එළඹීමට සිදුවිය.	මුදල් රෙගුලාසි ප්‍රකාරව බැරකම් ප්‍රමාණය එම වර්ෂයේ ප්‍රතිපාදනය නොඉක්ම විය යුතු වීම.
(ආ)	2021 වර්ෂය තුළ නිරවුල් කළ රු. 332,931 ක් වටිනා බැදීම් හා බැරකම් 05 ක් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන වල බැදීම් හා බැරකම් ලෙස ඇතුලත් කර නොතිබුණි.	2021 වර්ෂය තුළ නිරවුල් කළ බැරකම් මූල්‍ය ප්‍රකාශවල ඇතුළත් නොවීම. නිරීක්ෂණය නිවැරදිය.	මූල්‍ය ප්‍රකාශන වල නිවැරදිව ඇතුලත් කළ යුතුය.

2.3 ගණන් දීමේ නිලධාරී විසින් සිදුකළ යුතු සහතිකවීම්

නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වාගෙන යනු ලබන බවට ගණන් දීමේ නිලධාරී සහතික විය යුතු අතර, එම පද්ධතියේ සඵලදායීතාවය පිළිබඳව කලින් කල සමාලෝචනය සිදුකර ඒ අනුව පද්ධති ඵලදායී ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදුකරනු ලැබිය යුතු බවත්, එම සමාලෝචනයන් ලිඛිතව සිදුකර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළයුතුව තිබුණත්, එවැනි සමාලෝචනයන් සිදුකළ බවට ප්‍රකාශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.	දෙපාර්තමේන්තුව තුල දැනට ක්‍රියාත්මක වන අභ්‍යන්තර පාලන ක්‍රම හි පවතින අඩුපාඩු හා දුර්වලතා පිළිබඳ ව අවස්ථානුකූලව අංශ ප්‍රධානී රැස්වීම් වල දී හා විගණන කළමණාකරණ රැස්වීම් වලදී සාකච්ඡා කර ඇති අතර එම අවස්ථාවලදී නිරීක්ෂණය වූ අඩුපාඩු හා දුර්වලතා සඳහා ක්‍රියාමාර්ග ගෙන ඇත.	2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය.

2.4 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

	නීති, රීති හා රෙගුලාසිවලට යොමුව	වටිනාකම රු.	අනුකූල නොවීම	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(i)	2015 මැයි 15 දිනැති මු.අ.01/2015/01 දරන මුදල් අමාත්‍යාංශයේ චක්‍රලේඛයේ 03 (අ) ඡේදය	201,234	විදේශ රජය හෝ ප්‍රදායක ආයතනය විසින් එතෙරදී දරනු ලබන ගමන් වියදම්, ගුවන් තොටුපල ගාස්තු, දුරකථන වියදම් වැනි අනියම් වියදම් පියවා ගැනීම සඳහා අනියම්	මෙම නිලධාරිනිය සහභාගී වූ ඉන්දියාවේ පැවති පුහුණු පාඨමාලාව පිළිබඳ ඉදිරිපත් කර ඇති ලිපියේ දක්වා ඇත්තේ ඉන්දියාවට යාමට සහ ආපසු ඒමට ගුවන් ටිකට්පත් සඳහා ගාස්තු, පාඨමාලා ගාස්තු,	දීමනා ගෙවීමේදී අදාළ චක්‍රලේඛ උපදෙස් වලට අනුකූලව ගෙවිය

		දීමනා ලෙස කිසියම් මුදලක් නොගෙවන විටකදී පමණක් දිනකට ඇමරිකන් ඩොලර් 40 බැගින් උපරිම දින 30 ක් සඳහා අනියම් දීමනා ගෙවිය හැකි වුවද ඉන්දියාවේ පැවැත්වූ පුහුණු පාඨමාලාවක් සඳහා ඉන්දීය රජය විසින් දිනකට ඉන්දීය රුපියල් 1500 (ඇමරිකන් ඩොලර් 21) බැගින් ගෙවීමක් හා අදාළ අනෙකුත් සියලුම පහසුකම් සපයන අවස්ථාවකදී එම පාඨමාලාවට සහභාගිවූ නිලධාරිනිය වෙත දෙපාර්තමේන්තුව මගින් චක්‍රලේඛයට පටහැනි ආකාරයෙන් අනියම් දීමනාව ගෙවා තිබුණි.	නවාතැන් පහසුකම්, ආහාරපාන, පාඨමාලාවේ කොටසක් වශයෙන් සිදුවන ගමනාගමන වියදම් හා ගුවන් තොටුපල දක්වා යාම් - ඒම් සඳහා ඉන්දියන් රුපියල් 1500 ක් ගෙවන බවයි. මේ වියදම් සඳහා පාඨමාලා අවශ්‍යතාවයන්ගෙන් බැහැරව ඉන්දියාව තුළ ගමන් වියදම්,ගුවන් තොටුපල ගාස්තු, දුරකථන ගාස්තු වැනි අනියම් වියදම් දරා ගැනීම සඳහා මුදලක් ඇතුලත්ව නොතිබූ බැවින් 2015 මැයි 15 දිනැති මු. අ.01/2015/01 දරන මුදල් අමාත්‍යාංශයේ චක්‍රලේඛයේ 03 (අ) ඡේදය ප්‍රකාරව නිලධාරිනියට අනියම් දීමනාව ගෙවන ලදී.	යුතුය.
(ii)	2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛ	2020 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ වාර්තාව විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි.	2020 වර්ෂයට අදාල භාණ්ඩ සමීක්ෂණ කටයුතු මේ වන විට සිදුකෙරෙමින් පවතින අතර දෙපාර්තමේන්තු කාර්ය මණ්ඩලය සීමාකර ඇති කාල වකවානුවක් බැවින් භාණ්ඩ අපහරණ කටයුතු සිදුකර ගැනීමට අපහසු වී ඇත. එම කටයුතු ඉටුකර	චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය.

			ගැනීමට හැකිවූ වහාම භාණ්ඩ සමීක්ෂණ කටයුතු අවසන් කර භාණ්ඩ සමීක්ෂණ වාර්තාව ඉදිරිපත් කරන බව දන්වමි.	
(iii)	අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ (3) ඡේදය	ක්‍රියාකාරී සැලැස්ම තුල අන්තර්ගත කළයුතු යාවත්කාලීන කළ ආයතනයේ සංවිධාන ව්‍යුහය, අනුමත කාර්ය මණ්ඩලය සහ දැනට සේවයේ සිටින කාර්ය මණ්ඩලය පිළිබඳ විස්තර, වාර්ෂික ක්‍රියාකාරකම් සඳහා වන අක්මුදල් අවශ්‍යතා සැලැස්ම හා අභ්‍යන්තර විගණන සැලැස්ම ඉදිරිපත් කර නොතිබුණි.	අතපසු වීමකින් ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් වී නැත.	චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය.

2.5 අත්තිකාරම් නිකුත් කිරීම හා පියවීම

නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
මුදල් අමාත්‍යාංශයේ අංක 03/2015 හා 2015 ජූලි 14 දිනැති චක්‍රලේඛය සහ අංක 01/2020 හා 2020 අගෝස්තු 28 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛවල සඳහන් උපදෙස් පරිදි තත්කාර්යය අතුරු අග්‍රිම ලබාගන්නා නිලධාරීන් විසින් එම කාර්යය අවසන් කර දින 10 ක් තුළ එම අග්‍රිම පියවිය යුතු වුවත් නිලධාරීන් තිදෙනෙකු අවස්ථා 04 කදී ලබාගන්නා ලද රු.362,000ක් සම්බන්ධයෙන් දින 33 සිට දින 125ක් දක්වා ප්‍රමාද වී පියවීම් සිදුකර තිබුණි.	මෙම වකවානුව තුල රටතුල ඇදිරිනීතිය ක්‍රියාත්මක වීම , රාජ්‍ය ආයතනවල සීමිත නිළධාරීන් පිරිසක් සේවයට වාර්තා කිරීම හා ක්‍රමානුකූලව ගනුදෙනු කිරීමට හැකියාවක් නොමැති වීම යන හේතූන් මත මෙම අත්තිකාරම් පියවීම ප්‍රමාද විය.	චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය.

2.6 තැන්පත් ශේෂයන්

විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
එකතුව රු. 7,488,595 ක් වූ කල් ඉකුත් තැන්පතු 10 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව රාජ්‍ය ආදායමට බැර කිරීමට හෝ හැකි ඉක්මනින් ආපසු ගෙවීමට හෝ කොන්ත්‍රාත් තැන්පතු සම්බන්ධයෙන් වූ විට කොන්ත්‍රාත්තු වලින් වූ අලාභ ආපසු අයකර ගැනීමට හෝ කටයුතු කර නොතිබුණි.	නව මාධ්‍ය මධ්‍යස්ථානයේ ඉදිකිරීම් කටයුතු වලට අදාල රදවා ගත් මුදල රු.7,488,595කි. මෙම රැඳවුම් මුදල නිදහස් කිරීම සඳහා කටයුතු කරමින් පවතී.	මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය.

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 කාර්යභාරයන් ඉටු නොකිරීම

විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
දෙපාර්තමේන්තුවේ අරමුණු සාක්ෂාත් කරගැනීම සඳහා වාර්ෂික අයවැය ලේඛනය අනුව සකස් කරන ලද ක්‍රියාකාරී සැලැස්මේ සමාලෝචිත වර්ෂය තුල ඉටුකිරීමට සැලසුම්කර තිබූ රු. මිලියන 10.5ක කාර්යයන් 34ක් 2020 දෙසැම්බර් 31 දිනට ඉදිරිපත් කළ ප්‍රගති වාර්තාව අනුව ඉටු කර නොමැති බව නිරීක්ෂණය විය.	2020 වර්ෂයේ රටතුල පැතිර ගිය කොවිඩ් 19 වසංගත තත්වය හමුවේ නිරෝධායන ඇදිරි නීතිය සහ සංචරණ සීමා පැනවීම හේතුවෙන්සීමා සහිත කාර්ය මණ්ඩලයක් පමණක් බොහෝ අවස්ථාවල දී කාර්යාලය වෙත කැඳවීමට සිදුව තිබූ බැවින් සහ අත්‍යාවශ්‍ය මාධ්‍ය ආවරණ සඳහා එලෙස සේවයේ නිරත වූ සීමිත කාර්ය මණ්ඩලය යෙදවීමට සිදු වූ බැවින් ද වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මේ බොහෝ කාර්යයන් එපරිදිම ඉටුකිරීමට නොහැකි විය	සැලසුම් කරන ලද කාර්යයන් අප්‍රමාදව ඉටුකරගැනීම කෙරෙහි අවධානය යොමුකළ යුතුය.

3.2 අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම

විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
දෙපාර්තමේන්තුවේ අරමුණු සාක්ෂාත් කරගැනීම සඳහා වාර්ෂික අයවැය ලේඛනය අනුව සකස් කරන ලද ක්‍රියාකාරී සැලැස්මේ සමාලෝචිත වර්ෂය තුල ඉටුකිරීමට සැලසුම්කර තිබූ කාර්යයන් 12ක ප්‍රගතිය සියයට 4 සිට සියයට 100ක් වූ අතර කාර්යයන් 17ක ප්‍රගතිය සඳහන්ව නොතිබුණු බව 2020 දෙසැම්බර් 31 දිනට ඉදිරිපත් කළ ප්‍රගති වාර්තාව අනුව නිරීක්ෂණය විය.	2020 වර්ෂයේ රටතුල පැතිර ගිය කොවිඩ් 19 වසංගත තත්වය හමුවේ නිරෝධායන ඇදිරි නීතිය සහ සංචරණ සීමා පැනවීම සමඟ කාර්ය මණ්ඩලය සීමා සහිතව කාර්යාලය වෙත කැඳවීමට සිදුව තිබූ හෙයින් සහ අත්‍යාවශ්‍ය මාධ්‍ය ආවරණ සඳහා සේවයේ නිරත වූ සීමිත කාර්ය මණ්ඩලය යෙදවීමට සිදු වූ නිසා වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මේ කාර්යයන් කිහිපයක අපේක්ෂිත මට්ටමේ නිමැවුමක් ලබා ගැනීමට නොහැකි විය.	අපේක්ෂිත නිමවුම් මට්ටම ලබාගැනීම සඳහා කටයුතු කළ යුතුය.

3.3 පාඩු හා හානි

විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
ජනමාධ්‍ය අමාත්‍යාංශයේ භාවිතය සඳහා යොදාගෙන තිබූ අංක PD 9625 දරන ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවට අයත් රථය 2016 දෙසැම්බර් 26 දින අනතුරකට ලක්වී තිබුණි. එම අනතුර සිදුවන අවස්ථාවේ රියදුරු බලපත්‍රයක් නොමැති පුද්ගලයෙකු රථය ධාවනය කර තිබුණි. එම අනතුරින් පසු රථය අලුත්වැඩියා කිරීම සඳහා රු.453,000 ක් දෙපාර්තමේන්තුව විසින් 2020 වර්ෂය තුළදී වැයකර තිබුණු අතර, රක්ෂණයෙන් කිසිදු වන්දි මුදලක් ලැබී	PD9625 යන අංක දරණ කැබි රථය අනතුරට ලක්වීමෙන් පසුව දීර්ඝ කාලයක් දෙපාර්තමේන්තු රථගාලේ ගාල් කර තිබුණු අතර අව්වැසි ආදියෙන් හානි වී රථය තවදුරටත් ප්‍රයෝජනයට ගත නොහැකි තත්ත්වයට පත්වීමෙන් වලක්වා ගැනීම සඳහා දෙපාර්තමේන්තුවේ වියදමෙන් මිලගණන් කැඳවා අළුත්වැඩියාව සිදු කරන ලදි. මෙම අනතුර සම්බන්ධයෙන් ජනමාධ්‍ය	රාජ්‍ය සම්පත් විධිමත් පරිදි භාවිතා කිරීම සඳහා ඒවාට සිදුවන හානි සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර මූල්‍ය ප්‍රකාශන තුලින් හෙලිදරව් කළ යුතුය

නොතිබුණි. එම හානිය සම්බන්ධව මූල්‍ය ප්‍රකාශන තුළින් හෙළිදරව් කර නොතිබුණි. 2016 දෙසැම්බර් 26 දින සිදුවූ අනතුර වෙනුවෙන් 2020 සැප්තැම්බර් 04 දින මුදල් රෙගුලාසි 104(3) යටතේ ප්‍රාරම්භක වාර්තාවක් ඉදිරිපත් කර තිබුණු අතර රු.453,000ක් රථය ධාවනය කළ පුද්ගලයාගෙන් අයකර ගැනීමට තීරණය කර තිබුනද වාර්තාවේ දින දක්වා එම අයකර ගැනීම් සිදුකර නොතිබුණි.

අමාත්‍යාංශය මඟින් මු.රෙ. 104 යටතේ පරීක්ෂණ කටයුතු අවසන් කර තිබෙන බවද, අදාළ අලාභය අයකර ගැනීම සඳහා වගකිවයුත්තන්ට එරෙහිව නීතිමය කටයුතු ආරම්භ කිරීම සඳහා නීතිපති දෙපාර්තමේන්තුවේ උපදෙස් ලබා ගැනීම සඳහා කටයුතු කර ඇති බවද, ජනමාධ්‍ය අමාත්‍යාංශයේ ලේකම් විසින් දැනුම් දී ඇත.

3.4 කළමනාකරණ දුර්වලතා

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	අධ්‍යක්ෂ (රජයේ චිත්‍රපට අංශය) තනතුරේ රාජකාරි ඉටු කිරීම සඳහා විධායක ගණයේ නිෂ්පාදක (දෙපාර්තමේන්තුගත) ලෙස කටයුතු කරන නිලධාරියා අවස්ථා 03 කදී රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය පරිදි පත්කර තිබුණි. මෙම තනතුර සඳහා 2019 ජූලි 01 දින සිට වසරක කාලයක් සඳහා පත්කිරීම සිදුකරන අවස්ථාවේදී කොන්ත්‍රාත් තනතුරට අදාළ පුරප්පාඩුව නොපමාව සම්පූර්ණ කිරීමට අවශ්‍ය පියවර ගන්නා ලෙස රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් උපදෙස් ලබාදී තිබුණ ද, දෙපාර්තමේන්තුව විසින් මෙම තනතුර සඳහා ඉහත නිලධාරියා දිගින් දිගටම රාජකාරී ඉටුකිරීමේ පදනමින් පත්කර තිබුණි.	රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ මග පෙන්වීම් අනුව ඉදිරි කාලයේ දී අයදුම් පත් කැඳවා සුදුසු නිලධාරියකු බඳවා ගැනීමට පියවර ගනු ලබන බව සඳහන් කරමි.	තනතුරු පුරප්පාඩු පියවීමට නොපමාව කටයුතු කළ යුතුය.

(ආ)	සේවය අතහැර ගොස් ඇති නිලධාරීන් තිදෙනෙකුගෙන් අයවියයුතු රු.211,486 ක්වූ වසර 19 කට වඩා පැරණි ශේෂයක් පැවති අතර 2021 පෙබරවාරි 28 දින වනවිටත් එම ශේෂයන් අයකරගෙන නොතිබුණි.	නිලධාරීන් දෙදෙනෙකුගේ ආපදා ණය ශේෂය අයකර ගැනීම සම්බන්ධව නීතිපති දෙපාර්තමේන්තුවේ උපදෙස් ඉල්ලා ඇති අතර, මේ වන තෙක් අදාළ උපදෙස් ලැබී නැත. අනෙක් නිලධාරිනිය තමන් සේවයෙන් හැර ගියා සේ සැලකීම පිළිබඳව අභියාචනයක් ඉතිරිපත් කර තිබෙන අතර එයින් ලැබෙන තීරණ මත ඇයගෙන් අයවිය යුතු මුදලද අය කරගැනීමට කටයුතු කරමි.	අයවියයුතු ශේෂ අයකර ගැනීමට අප්‍රමාදව කටයුතු කළ යුතුය.
(ඇ)	2020 දෙසැම්බර් 19 දින මියගිය නිලධාරියෙකුගෙන් අයවිය යුතු රු. 159,870 ක ණය ශේෂය 2021 පෙබරවාරි 28 දින වනවිටත් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.	2020 දෙසැම්බර් 19 දින මියගිය බී. එස්. ඩී. ප්‍රේමසුන්දර මහතාගෙන් අයවිය යුතු රු. 159,870/= ක ණය ශේෂය ඔහුගේ යැපෙන්නන් වෙතින් අයකර ගැනීම සඳහා කටයුතු කරමින් පවතී.	අයවියයුතු ශේෂ අයකර ගැනීමට අප්‍රමාදව කටයුතු කළ යුතුය.

4. තිරසාර සංවර්ධන අරමුණු ළඟා කර ගැනීම

නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
තිරසර සංවර්ධන ඉලක්කයක් ලෙස ජනමාධ්‍යවේදීන් සඳහා හැඳුනුම්පත් පරිගණකගත ක්‍රමවේදයකට ලබාදීම හඳුනාගෙන තිබුණු අතර එහි ප්‍රගතිය සියයට සියයක් ලෙස දක්වා තිබුණ ද, තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ප්‍රගතිය යටතේ එම ක්‍රියාවලිය පරිගණකගත කිරීම සඳහා අවශ්‍ය මෘදුකාංගය ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනය හා එක්ව නිර්මාණය කර ක්‍රියාත්මක කිරීම 2021 වසරේ සිට ආරම්භ කිරීමට හැකි වීම ලෙස දක්වා තිබීම නිසා එම කරුණු අතර පරස්පරතාවයක් නිරීක්ෂණය විය.	2020 වර්ෂයේ දී පැවති කොවිඩ් 19 වසංගත තත්ත්වය මත අදාළ මෘදුකාංගය භාවිතයෙන් ජනමාධ්‍යවේදීන් සඳහා හැඳුනුම්පත් නිකුත් කිරීම පිළිබඳ ව ප්‍රමාණවත් පුහුණුවක් අදාළ කාර්ය මණ්ඩයලට ලබාදීමට නොහැකි විය. එම පුහුණු කිරීම සඳහා 2021 වර්ෂයේ මුල් මාස කිහිපයක් ගත විය. මේ වනවිට එම පුහුණුවීම් ලබා දීමෙන් පසුව එහි කටයුතු ක්‍රියාවට නැගෙමින් පවතී.	වාර්තාවල නිවැරදි තොරතුරු ඉදිරිපත් කළ යුතුය.

5. මානව සම්පත් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

	නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	2020 වර්ෂයේදී අනුමත සේවක සංඛ්‍යාව 343 ක් වී තිබුණු අතර තථ්‍ය සේවක සංඛ්‍යාව 237 ක් වීම නිසා පුරප්පාඩු 106 ක් පවතින අතර මෙම පුරප්පාඩු පිරවීම සඳහා මෙම වාර්තාවේ දිනය දක්වා ක්‍රියාකර නොතිබුණි.	අදාළ පුරප්පාඩු අතරින්, ඒකාබද්ධ සේවාවන්ට අදාළ පුරප්පාඩු සම්පූර්ණ කරවා ගැනීම සඳහා රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය දැනුවත් කර ඇත. එසේම, දෙපාර්තමේන්තුගත තනතුරු සඳහා වන පුරප්පාඩු සඳහා බඳවා ගැනීම සඳහා අදාළ කාර්යයන් සිදු වෙමින් පවතී.	පුරප්පාඩු පිරවීම සඳහා කටයුතු කළ යුතුය

(ආ)	2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 40 (1) වගන්තිය ප්‍රකාරව ගණන්දීමේ නිලධාරී විසින් දෙපාර්තමේන්තුවක් සඳහා අභ්‍යන්තර විගණකවරයෙකු පත්කළ යුතු වුවද රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව සඳහා අභ්‍යන්තර විගණකවරයෙකු 2021 අප්‍රේල් වනවිටත් පත්කර නොතිබුණි	දෙපාර්තමේන්තුව සඳහා අභ්‍යන්තර විගණකවරයෙක් පත්කරන ලෙස රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය දැනුවත් කර ඇත. එසේම, එම තනතුර සඳහා ස්ථීර නිලධාරියෙක් පත්කරන තෙක්, වැඩබලන පදනමින් හෝ නිලධාරියෙක් පත් කරන ලෙස ජනමාධ්‍ය අමාත්‍යාංශය දැනුවත් කර තිබේ.	පනතේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය

04 පරිච්ඡේදය

කාර්ය සාධන දර්ශක

කාර්ය සාධන දර්ශක

4.1 ආයතනයේ කාර්ය සාධන දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව)

විශේෂිත දර්ශක	අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමැවුම්		
	100% - 90%	**75% - 89%**	**50% - 74%**
තොරතුරු දැන ගැනීමේ අයිතිය ප්‍රවර්ධනය කිරීම සඳහා රජයේ සංවර්ධන ප්‍රචාරණ වැඩපිළිවෙල පිළිබඳ තොරතුරු ජනතාව වෙත සන්නිවේදනය කිරීම	90%	-	-
රජයේ නිල පුවත් වෙබ් අඩවිය භාෂා ත්‍රිත්වයෙන් යාවත්කාලීන කිරීම	100%	-	-
රජයේ නිල පුවත් වෙබ් අඩවියට ප්‍රවෘත්ති සම්පාදනය කිරීම	100%	-	-
රජයේ නිල පුවත් වෙබ් අඩවියට වීඩියෝ ප්‍රවෘත්ති සම්පාදනය කිරීම	100%	-	-
සමාජ මාධ්‍ය ජාලය පුළුල් කිරීම හා ප්‍රවෘත්ති ජනගත කිරීම	100%	-	-
Face book, You Tube පරිහරණය කරන්නන් ඉහළ නැංවීම	-	75%	-
දිස්ත්‍රික් මට්ටමින් ප්‍රවෘත්ති හා විශේෂාංග ලිපි නිකුත් කිරීම සහ එම ප්‍රවෘත්ති Face book පිටුව වෙත ඇතුළත් කිරීම	100%	-	-
දුරකථන නාමාවලිය සකස් කිරීම	100%	-	-
ප්‍රාදේශීය මාධ්‍යවේදීන්ගේ නාම ලේඛන යාවත්කාලීන කිරීම	100%	-	-

දිස්ත්‍රික් මාධ්‍ය ඒකක සහ ප්‍රකාශන කාර්යාංශ ස්ථාපිත කිරීම	-	-	50%
Smart Media Trending Project (ස්මාට් මාධ්‍ය නැඹුරු ව්‍යාපෘතිය)	-	-	10%
Mojo Project (ජංගම ජනමාධ්‍ය ජාතික මධ්‍යස්ථාන ව්‍යාපෘතිය)	-	-	10%
On Demand Digital Media Awareness Project (ඩිජිටල් මාධ්‍ය ඉල්ලුම් දැනුවත් කිරීමේ ව්‍යාපෘතිය) • Fiber Network System to Medium Level Project (ෆයිබර් ජාලකරණ ව්‍යාපෘතිය) • Media ID Card Automated System (මාධ්‍ය හැඳුනුම්පත් පරිගණක ගත කිරීමේ ක්‍රමවේදය) • Firewall System • Dgi.lk Domain • Data & Voice Cable Neat Project – Part II (දත්ත හා හඬ රැහැන් පිළිසකර කිරීමේ ව්‍යාපෘතිය II)	100% 100% - - -	- - 75% - -	- - - 35% 10%
මාධ්‍යවේදීන් සහ විශේෂ අවස්ථා සඳහා මාධ්‍ය හැඳුනුම්පත් නිකුත් කිරීම	100%	-	-

05 පරිච්ඡේදය

තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය

තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය

5.1 හඳුනා ගන්නා ලද අදාළ තිරසාර සංවර්ධන අරමුණු දක්වන්න

ඉලක්කය/ අරමුණ	ඉලක්ක	ජයග්‍රහණ දර්ශක	මේ දක්වා ජයග්‍රහණ ලබා ගැනීමේ ප්‍රගතිය		
			0% - 49%	50% - 74%	75% - 100%
ප්‍රාදේශීය මාධ්‍යවේදීන්/ පාසල් ළමුන් (ජනමාධ්‍ය විෂය හදාරණ) පුහුණු කිරීම	දිස්ත්‍රික්කවල සිටින මාධ්‍යවේදීන් හා පාසල් ළමුන් සඳහා ඩිජිටල් සමාජ මාධ්‍ය ක්‍රියාකාරීත්වය හඳුන්වා දීම	මාධ්‍යවේදීන් 25ක් පාසල් ජනමාධ්‍යවේදීන් 100ක් මාර්තු වන විට පුහුණු කරන ලදි	10%	-	-
ඩිජිටල් මාධ්‍ය ඉල්ලුම් දැනුවත් කිරීම වර්ධනය හා ෆයිබර් ජාලකරණය	රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව ඩිජිටල්කරණයට ක්‍රමවත්ව ලක් කිරීම	සමාජ මාධ්‍ය සජීවී වැඩසටහන් සඳහා Mbps ප්‍රමාණය බාධාවකින් තොරව ලබා දීම	-	-	100%
මාධ්‍ය හැඳුනුම්පත් සකස් කිරීමේ දත්ත පද්ධතියක් සකස් කිරීම	මාධ්‍යවේදීන්ගේ තොරතුරු ඉතා ඉක්මණින් ලබා ගැනීම සඳහා තොරතුරු පද්ධතියක් සකස් කිරීම හා ජනමාධ්‍යවේදීන් සඳහා හැඳුනුම්පත් පරිගණකගත ක්‍රමවේදයකට ලබා දීම	ජනමාධ්‍යවේදීන් සඳහා Data Base සැකසීමට හැකි වීම	-	-	100%
ජාතික Mojo මධ්‍යස්ථානය ඇති කිරීම	නව ලොව ඩිජිටල් ප්‍රවනතා ආරම්භ කිරීම	අනුමත ව්‍යාපෘතියකි (මුදල් ප්‍රතිපාදන ලැබී නොමැත)	10%	-	-

5.2 තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ හා අභියෝග සැකෙවින් විස්තර කරන්න

තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ :

රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව විසින් තිරසර සංවර්ධන අරමුණු සම්බන්ධව ජනතාව දැනුවත් කිරීම හා ඒ සම්බන්ධව පුළුල් අවබෝධයක් ලබා දීම වෙනුවෙන් You tube හා Face book යන සමාජ ජාලා භාවිතා කිරීම ආරම්භ කරන ලදී.

එසේම ආයතන පරිශ්‍රයේ මෙතෙක් කලක් අපිළිවෙළට සකසා තිබූ Data & Voice Cable ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනය ලවා පිළිසකර කරන ලදි. ජංගම ජනමාධ්‍යවේදී මධ්‍යස්ථානය (Mobile Journalism Center / Mojo Project) ව්‍යාපෘතිය සඳහා රුපියල් මිලියන 100ක් අනුමතව ඇත. එය විශේෂ ජයග්‍රහණයකි. එසේම ජනමාධ්‍යවේදී හැඳුනුම්පත් නිකුත් කිරීමේ ක්‍රියාවලිය පරිගණකගත කිරීම සඳහා අවශ්‍ය මෘදුකාංගය ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනය හා එක්ව නිර්මාණය කර ක්‍රියාත්මක කිරීම 2021 වසරේ සිට ආරම්භ කිරීමට හැකි වීම ප්‍රධාන ජයග්‍රහණයකි.

අභියෝග :

පවතින තරඟකාරී වටපිටාව තුළ සමාජ මාධ්‍ය තුළින් ජනතාවට නිවැරදි හා විශ්වසනීය තොරතුරු ඉක්මණින් ලබා දීම සඳහා පවතින මානව හා ප්‍රාග්ධන සම්පත්වල හිඟය යම් අවස්ථාවන්වලදී ගැටළු පැන නැගීමට හේතු වී ඇත.

06 පරිච්ඡේදය

මානව සම්පත් පැතිකඩ

මානව සම්පත් පැතිකඩ

06.1 සේවක සංඛ්‍යා කළමනාකරණය

	අනුමත සේවක සංඛ්‍යාව	පවතින සේවක සංඛ්‍යාව	ඇබෑර්තු / (අතිරික්ත) **
ජ්‍යෙෂ්ඨ	17	12	05
තෘතීයික	16	02	14
ද්විතියික	244	176	68
ප්‍රාථමික	53	46	07

06.2 ** ආයතනයේ කාර්ය සාධනය උදෙසා මානව සම්පත් හිඟය හෝ අතිරික්තය බලපානු ලැබ ඇත්තේ කෙසේදැයි කෙටියෙන් සඳහන් කරන්න.

තෘතීයික මට්ටමේ සහ ද්විතියික මට්ටමේ මානව සම්පත් හිඟය දෙපාර්තමේන්තුවේ කාර්ය සාධනය උදෙසා සෘජුවම බලපා ඇත. විශේෂයෙන් තාක්ෂණික කාර්යභාරය ඉටු කරන කාර්ය මණ්ඩලයේ පුරප්පාඩු පැවතීම හේතුවෙන් දෛනික රාජකාරී කටයුතු ඉටු කර ගැනීමේදී අපහසුතාවයක් පවතී. ඒ සඳහා දෙපාර්තමේන්තුගත තනතුරුවල සේවයේ යෙදී සිටි දැනුම සහ කුසලතාවයෙන් යුතු නිලධාරීන් විශ්‍රාම යාම ප්‍රධානම හේතුව වී ඇත. නවක නිලධාරීන්ට එම පුහුණුව ලබා දීමට විශාල කාලයක් ගත වනු ඇත. එසේම එම තනතුරුවල පුරප්පාඩු සඳහා උසස්වීම් ලබා දීමට ඇති බාධා හේතුවෙන් ද මේවන විට විවිධ මට්ටම්වල තනතුරු සඳහා නිලධාරී හිඟයක් ඇති වී තිබේ.

06.3 මානව සම්පත් සංවර්ධනය

වැඩසටහනේ නම	පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව	වැඩසටහනේ කාල සීමාව	සමස්ථ ආයෝජනය (RS'000)		වැඩසටහනේ ස්වභාවය (දේශීය/ විදේශීය)	නිමැවුම/ ලබා ගත් දැනුම*
			දේශීය රු.	විදේශීය රු.		
පුහුණු පාඨමාලා	36	2020.01.01 දින සිට 2020.12.31 දින දක්වා කාල සීමාව තුළ	181,000/-	-	දේශීය	ඒ, ඒ විෂයයන්ට අදාළව විෂය දැනුමක් ලබා ගැනීම
පුහුණු වැඩමුළු	01	2020.02.16 දින සිට 2020.03.14 දින දක්වා	-	1,080 US $	විදේශීය	කෙටි චිත්‍රපට සහ කෙටි චිත්‍රපට සකස් කිරීමට අදාළ දැනුම ලබා ගැනීම

* ආයතනයේ කාර්ය සාධනය උදෙසා පුහුණු වැඩසටහන් දායක වන්නේ කෙසේද යන්න කෙටියෙන් පැහැදිලි කරන්න.

රාජ්‍ය සේවයට නවක පත්වීම් ලද නිලධාරීන් අනුයුක්ත කර සිටින අංශවලට හා පවරනු ලබන රාජකාරීවලට අදාළව බාහිර ආයතන මඟින් නිසි පුහුණුවක් ලබා දීම තුළින් තම රාජකාරී නිවැරදිව, ක්‍රමානුකූලව හා කාර්යක්ෂමතාවයෙන් යුතුව ඉටු කිරීමට හැකියාව ලැබෙනු ඇත. එසේම කාර්ය මණ්ඩල අභිප්‍රේරණයක් ළඟා කර ගැනීම මෙමඟින් අපේක්ෂිතය. නව දැනුම උකහා ගැනීමට හා දැනුම යාවත්කාලීන කර ගැනීමට අවස්ථාව සලසා දීම මඟින් දෙපාර්තමේන්තුවේ කාර්යසාධනය ඉහළ මට්ටමකට ගෙන ඒමට විශාල පිටුවහලක් වනු ඇතැයි අපේක්ෂා කරනු ලැබේ.

එසේම විද්‌ශීය පුහුණු සඳහා නිලධාරීන් යොමු කිරීම තුළින් දෙපාර්තමේන්තුවේ චිත්‍රපට අංශය යටතේ පවතින කටයුතු ඩිජිටල්කරණය කිරීම විධිමත් කිරීමට හැකියාව ලැබී ඇත. එනම්, පැරණි චිත්‍රපට, වාර්තා චිත්‍රපට සංරක්ෂණය කිරීම සඳහා ඩිජිටල්කරණය කිරීම ආරම්භ වී ඇති අතර අනාගතයේදී මහජනතාවට / මාධ්‍යවේදීන්ට හෝ අවශ්‍ය වෙනත් කෙනෙකුට අවශ්‍ය අවස්ථාවන්වලදී පරිහරණය කිරීමට හෝ දැක බලා ගැනීමට අවස්ථාව ලබා දීමට අපේක්ෂිතය.

2020 වර්ෂයේ රටෙහි පැවති කොරෝනා වසංගත තත්වය හේතුවෙන් වැඩි කාලයක්, නිලධාරීන් බොහෝ පිරිසක් නිවසේ සිට රාජකාරී ඉටු කරන ලද අතර වෙනත් ආයතන වෙත පුහුණුව සඳහා යැවීමේ ප්‍රායෝගික අපහසුතා පැවතීම හේතුවෙන් දේශීය හෝ විදේශීය පුහුණු පාඨමාලා සඳහා යොමු කිරීම සමස්ථයක් ලෙස අඩපණ විය.

07 පරිච්ඡේදය

අනුකූලතා වාර්තාව

අනුකූලතා වාර්තාව

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේදී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
1	**පහත සඳහන් මූල්‍ය ප්‍රකාශ/ ගිණුම් නියමිත දිනට ඉදිරිපත් කොට තිබේ**			
1.1	වාර්ෂික මූල්‍ය ප්‍රකාශ	අනුකූල වේ	-	-
1.2	රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම	අනුකූල වේ	-	-
1.3	ව්‍යාපාර හා නිෂ්පාදන අත්තිකාරම් ගිණුම් (වාණිජ අත්තිකාරම් ගිණුම්)	අදාළ නොවේ	-	-
1.4	ගබඩා අත්තිකාරම් ගිණුම්	අදාළ නොවේ	-	-
1.5	විශේෂ අත්තිකාරම් ගිණුම්	අදාළ නොවේ	-	-
1.6	වෙනත්	අදාළ නොවේ	-	-
2	**පොත්පත් හා ලේඛන නඩත්තු කිරීම (මු.රෙ.445)**			
2.1	රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 267/2018 අනුව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල නොවේ	රා.ගි.ව.අංක 271/2019 (මූල්‍ය ප්‍රකාශන - 2019) මඟින් තවදුරටත් එම ලේඛන පවත්වාගෙන යාම අත්‍යවශ්‍ය නොවන බව දන්වා ඇත	
2.2	පුද්ගල පඩිනඩි ලේඛන/ පුද්ගල පඩිනඩි කාඩ්පත් යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ	-	-

2.3	විගණන විමසුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ	-	-
2.4	අභ්‍යන්තර විගණන වාර්තා ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ	-	-
2.5	සියළුම මාසික ගිණුම් සාරාංශ (CIGAS) පිළියෙල කර නියමිත දිනට මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම	අනුකූල වේ	-	-
2.6	චෙක්පත් හා මුදල් ඇණවුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ	-	-
2.7	ඉන්වෙන්ට්‍රි ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ	-	-
2.8	තොග ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ	-	-
2.9	හානි පාඩු ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ	-	-
2.10	බැරකම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ	-	-
2.11	උප පත්‍රිකා පොත් ලේඛනය (GA – N 20) යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ	-	-
03	**මූල්‍ය පාලනය සඳහා කාර්යයන් අභිනියෝජනය කිරීම (මු.රෙ.135)**			
3.1	මූල්‍ය බලතල ආයතනය තුළ බලතල පවරා දී තිබීම	අනුකූල වේ	-	-

3.2	මූල්‍ය බලතල පවරා දීම පිළිබඳ ආයතනය තුළ දැනුවත් කර තිබීම	අනුකූල වේ	-	-
3.3	සෑම ගණුදෙනුවක්ම නිලධාරීන් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් හරහා අනුමත වන පරිදි බලතල පවරා දී තිබීම	අනුකූල වේ	-	-
3.4	2014.05.11 දිනැති 171/2004 දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය අනුව, රජයේ පඩිපත් මෘදුකාංග පැකේජය භාවිතා කිරීමේදී ගණකාධිකාරීවරයන්ගේ පාලනයට යටත්ව කටයුතු කිරීම	අනුකූල වේ	-	-
4	**වාර්ෂික සැලසුම් සකස් කිරීම**			
4.1	වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ	-	-
4.2	වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ	-	-
4.3	වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	අදාළ නොවේ	-	-
4.4	වාර්ෂික ඇස්තමේන්තුව සකස් කොට ජාතික අයවැය දෙපාර්තමේන්තුවට (NBD) නියමිත දිනට ඉදිරිපත් කිරීම	අනුකූල වේ	-	-
4.5	වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශය නියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම්	අනුකූල වේ	-	-

	දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම			
5	**විගණන විමසුම්**			
5.1	විගණකාධිපතිවරයා විසින් නියම කොට ඇති දිනට, සියළුම විගණන විමසුම්වලට පිළිතුරු ලබා දී තිබීම	අනුකූල වේ	-	-
6	**අභ්‍යන්තර විගණනය**			
6.1	මු.රෙ.134(2) DMA/1-2019 අනුව, වසර ආරම්භයේදී විගණකාධිපතිවරයා සමඟ සාකච්ඡා කිරීමෙන් අනතුරුව, අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	අනුකූල නොවේ	අභ්‍යන්තර විගණක තනතුරට නිලධාරියෙකු පත් කර නොමැත	-
6.2	සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකටම මාසයක කාලයක් තුළදී පිළිතුරු සපයා තිබීම	අනුකූල වේ		
6.3	2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 40(4) උප වගන්තිය ප්‍රකාරව, සියළුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම	අදාළ නොවේ		
6.4	මුදල් රෙගුලාසි 134(3) ප්‍රකාරව, සියළුම අභ්‍යන්තර	අදාළ නොවේ		

	විගණන වාර්තාවල පිටපත් විගණකාධිපතිවරයාට ඉදිරිපත් කර තිබීම			
7	**විගණන හා කළමනාකරණ කමිටු**			
7.1	DMA චක්‍රලේඛ 1-2019 අනුව, අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු 04ක් වත් අදාළ වර්ෂය තුළ පවත්වාගෙන තිබීම	අනුකූල නොවේ	රටේ පවතින වාතාවරණය මත පැවැත්වීමට නොහැකි විය	ඉදිරියේදී චක්‍රලේඛ අනුව ක්‍රියාකරනු ලැබේ
8	**වත්කම් කළමනාකරණය**			
8.1	අංක 01/2017 දරණ වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 07 වන පරිච්ඡේදය අනුව, වත්කම් මිලදී ගැනීම් හා අපහරණය කිරීම් පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
8.2	ඉහත සඳහන් චක්‍රලේඛයේ 13 වන පරිච්ඡේදය ප්‍රකාරව, එම චක්‍රලේඛයේ විධි විධාන ක්‍රියාත්මක කිරීම, සම්බන්ධීකරණය සඳහා සුදුසු සම්බන්ධතා නිලධාරියෙකු පත් කර එම නිලධාරියා පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලයට වාර්තා කර තිබීම	අනුකූල වේ	-	-

8.3	රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 05/2016 අනුව, භාණ්ඩ සමීක්ෂණ පවත්වා අදාළ වාර්තා නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල නොවේ	භාණ්ඩ සමීක්ෂණ කටයුතු කෙරෙමින් පවතී	
8.4	වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌනතා හා වෙනත් නිර්දේශ චක්‍රලේඛයේ සඳහන් කාලය තුළ සිදු කොට තිබීම	අනුකූල නොවේ	භාණ්ඩ සමීක්ෂණ කටයුතු කෙරෙමින් පවතී	
8.5	ගර්හිත භාණ්ඩ අපහරණය කිරීම මු.රෙ.772 අනුව සිදු කිරීම	අනුකූල නොවේ	භාණ්ඩ සමීක්ෂණ කටයුතු කෙරෙමින් පවතී	
9	**වාහන කළමනාකරණය**			
9.1	සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස් කොට නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම	අනුකූල වේ	-	-
9.2	වාහන ගර්හිත වී මාස 06කට වඩා අඩු කාලයකදී අපහරණය කර තිබීම	අනුකූල නොවේ	මේ සඳහා වන ක්‍රියාවලියට දිගු කාලයක් ගත වීම	භාවිතයෙන් ඉවත් කරනු ලබන වාහන නිවැරදිව හඳුනාගෙන අදාළ කටයුතු කඩිනමින් ඉටු කිරීම
9.3	වාහන ලොග් පොත් පවත්වා ගනිමින් ඒවා යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ	-	-
9.4	සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන්ම මු.රෙ.103,	අනුකූල නොවේ	සිදු වී ඇති, එහෙත් මේ වන විට පරීක්ෂණ පවත්වා නොමැති සියළුම වාහන	

	104, 109 හා 110 ප්‍රකාරව කටයුතු කිරීම		අනතුරුවල පරීක්ෂණ පැවැත්වීමේ කටයුතු සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගනිමින් පවතී	
9.5	2016.12.29 දිනැති අංක 2016/30 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධි විධාන ප්‍රකාරව, වාහනවල ඉන්ධන දහනය වීම නැවත පරීක්ෂා කිරීම	අනුකූල වේ	-	-
9.6	කල්බදු කාල සීමාවෙන් අනතුරුව, බදු වාහන ලොග් පොත්වල සම්පූර්ණ අයිතිය පවරා ගෙන තිබීම	අනුකූල වේ	-	-
10	**බැංකු ගිණුම් කළමනාකරණය**			
10.1	නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙල කර සහතික කර ඒවා විගණනය සඳහ ඉදිරිපත් කර තිබීම	අනුකූල නොවේ	රටේ පැවති වාතාවරණය මත නියමිත දිනට ඉදිරිපත් කිරීමට නොහැකි වීම	නියමිත දිනට පිළියෙල කිරීම
10.2	සමාලෝචිත වර්ෂයේදී හෝ ඊට පෙර වර්ෂවල සිට ඉදිරියට රැගෙන ආ අක්‍රිය බැංකු ගිණුම් නිරවුල් කර තිබීම	අනුකූල වේ	-	-
10.3	බැංකු සැසඳුම් ප්‍රකාශවලින් අනාවරණය වූ හා ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මුදල්	අනුකූල නොවේ	රටේ පැවති වාතාවරණය මත මු.රෙ.ප්‍රකාරව ක්‍රියා	මු.රෙ.ප්‍රකාරව කටයුතු කිරීම

	රෙගුලාසි ප්‍රකාරව කටයුතු කොට එම ශේෂ මාසයක කාලයක් ඇතුළත නිරවුල් කර තිබීම		කිරීමට නොහැකි වීම	
11	**ප්‍රතිපාදන උපයෝජනය**			
11.1	සලසා තිබූ ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම	අනුකූල වේ	-	-
11.2	මු.රෙ.94(1) ප්‍රකාරව, සලසන ලද ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු වර්ෂ අවසානයේදී ඉතිරි ප්‍රතිපාදන සීමාව නොඉක්මවන පරිදි බැරකම්වලට එළඹීම	අනුකූල නොවේ	රජයේ අත්‍යවශ්‍ය ප්‍රචාරණ කටයුතු සිදු කිරීමට සිදු වීම හේතුවෙන් ඉතිරි ප්‍රතිපාදන සීමාව ඉක්මවා බැරකම්වලට එළඹීමට සිදු වීම	වර්ෂ අවසාන ඉතිරි ප්‍රතිපාදන සීමාව නොඉක්මවන පරිදි බැරකම්වලට එළඹීමට කටයුතු කිරීම
12	**රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම්**			
12.1	සීමාවන්වලට අනුකූල වීම	අනුකූල වේ	-	-
12.2	හිඟ හිටි ණය ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදු කර තිබීම	අනුකූල වේ	-	-
12.3	වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන හිඟ හිටි ණය ශේෂ නිරවුල් කර තිබීම	අනුකූල නොවේ	නීතිපති උපදෙස් ඉල්ලා ඇති අතර, නීතිපති උපදෙස් ලැබුණු පසු ඉදිරි ක්‍රියාමාර්ග ගනු ලැබේ	ඉදිරියේදී නිසි කලට ණය ශේෂ නිරවුල් කිරීමට කටයුතු කිරීම

13	**පොදු තැන්පත් ගිණුම**			
13.1	කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ.571 ප්‍රකාරව කටයුතු කර තිබීම	අනුකූල නොවේ	මාධ්‍ය මධ්‍යස්ථාන ගොඩනැගිල්ලට අදාළ ගැටළු මේ දක්වා විසඳී නොමැත	රඳවා ගැනීම් මු.රෙ.ප්‍රකාරව නිදහස් කිරීමට කටයුතු කිරීම
13.2	පොදු තැන්පතු සඳහා වන පාලන ගිණුම යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ	-	-
14	**අග්‍රීම ගිණුම**			
14.1	සමාලෝචිත වර්ෂය අවසානයේ දී මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර තිබීම	අනුකූල වේ	-	-
14.2	මු.රෙ.371 ප්‍රකාරව නිකුත් කළ තත්කාරිය අතුරු අග්‍රීම, එම කාර්යය අවසන් වී මාසයක් ඇතුළත නිරවුල් කර තිබීම	අනුකූල නොවේ	රටේ පැවති වාතාවරණය මත අදාළ කාර්යයන් නිම වී මාසයක් ඇතුළත නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රීම නිරවුල් කිරීමට නොහැකි වීම	මු.රෙ.371 ප්‍රකාරව කටයුතු කිරීම
14.3	මු.රෙ.371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදි තත්කාර්ය අතුරු අග්‍රීම නිකුත් කර තිබීම	අනුකූල වේ	-	-

14.4	අග්‍රීම ගිණුමේ ශේෂය, භාණ්ඩාගාරයේ පොත් සමඟ මාසිකව සැසඳුම් කිරීම	අනුකූල වේ	-	-
15	**ආදායම් ගිණුම**			
15.1	අදාළ රෙගුලාසිවලට අනුකූලව, රැස් කළ ආදායමෙන් ආපසු ගෙවීම් සිදු කොට තිබීම	අනුකූල වේ	-	-
15.2	රැස් කර තිබූ ආදායම්, තැන්පතු ගිණුමට බැර නොකොට සෘජුවම ආදායමට බැර කර තිබීම	අනුකූල වේ	-	-
15.3	මු.රෙ.176 අනුව හිඟ ආදායම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම	අදාළ නොවේ	-	-
16	**මානව සම්පත් කළමනාකරණය**			
16.1	අනුමත කාර්ය මණ්ඩල සීමාව තුළ කාර්ය මණ්ඩලය පවත්වා ගෙන යාම	අනුකූල වේ	-	-
16.2	කාර්ය මණ්ඩලයේ සියළුම සාමාජිකයින් වෙත රාජකාරී ලැයිස්තු ලිඛිතව ලබා දී තිබීම	අනුකූල නොවේ	දැනට පාලන හා ගිණුම් අංශවල නිලධාරීන්ට පමණක් ලබා දී ඇති අතර, ඉදිරියේදී දෙපාර්තමේන්තුවේ සියලුම අංශවල නිලධාරීන්ට ලබා දීමට කටයුතු කරමින් පවතී	
16.3	2017.09.20 දිනැති MSD චක්‍රලේඛ අංක 04/2017 ප්‍රකාරව සියළුම වාර්තා, කළමනාකරණ සේවා	අනුකූල වේ	-	-

	දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබීම			
17	**මහජනයා වෙත තොරතුරු ලබා දීම**			
17.1	තොරතුරු දැන ගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලධාරියෙකු පත් කොට තොරතුරු ලබා දීමේ ලේඛනයක් යාවත්කාලීන කර පවත්වා ගෙන යාම	අනුකූල වේ	-	-
17.2	ආයතනය පිළිබඳ තොරතුරු එහි වෙබ් අඩවිය හරහා ලබා දී තිබෙන අතර, වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා ආයතනය පිළිබඳ මහජනයාගේ ප්‍රශංසා / චෝදනා පල කිරීමට පහසුකම් සලසා තිබීම	අනුකූල වේ	-	-
17.3	තොරතුරු දැන ගැනීමේ පනතේ 08 වන හා 10 වන වගන්ති ප්‍රකාරව වසරකට දෙවතාවක් හෝ වසරකට වරක් වාර්තා ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ	-	-
18	**පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම**			
18.1	අංක 05/2008 හා 05/2018(1) දරණ රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ චක්‍රලේඛ අනුව පුරවැසි/ සේවාලාභී	අනුකූල නොවේ	ඉදිරියේදී සකස් කිරීමට බලාපොරොත්තු වේ	

	ප්‍රඥප්තියක් සම්පාදනය කොට ක්‍රියාත්මක කිරීම			
18.2	එම චක්‍රලේඛයේ 2.3 ඡේදය පරිදි, පුරවැසි/ සේවාලාභී ප්‍රඥප්තිය සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීමේ කටයුතු අධීක්ෂණය කිරීම හා ඇගයීම සඳහා ආයතන විසින් ක්‍රමවේදයක් සකස් කොට තිබීම	අනුකූල නොවේ	ඉදිරියේදී සකස් කිරීමට බලාපොරොත්තු වේ	
19	**මානව සම්පත් සැලැස්ම සම්පාදනය කිරීම**			
19.1	2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2018 ඇමුණුම 02 ආකෘතිය පදනම් කරගෙන මානව සම්පත් සැලැස්මක් සකස් කොට තිබීම	අනුකූල නොවේ	ඉදිරියේදී සකස් කිරීමට බලාපොරොත්තු වේ	
19.2	කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයෙකු සඳහාම වර්ෂයකට අවම වශයෙන් පැය 12කට නොඅඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැලැස්ම තුළ තහවුරු කොට තිබීම	අනුකූල වේ	-	-
19.3	ඉහත සඳහන් චක්‍රලේඛයේ ඇමුණුම 01හි දැක්වෙන ආකෘතිය පදනම් කරගෙන සමස්ත කාර්ය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්ය	අනුකූල නොවේ	ඉදිරියේදී ගිවිසුම් අත්සන් කර ගැනීමට කටයුතු කරනු ලැබේ	

	සාධන ගිවිසුම් අත්සන් කර තිබීම			
19.4	ඉහත චක්‍රලේඛයේ 6.5 ඡේදය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙල කිරීම, ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවර්ධනය කිරීම, නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම් පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත් කොට තිබීම	අනුකූල නොවේ	ඉදිරියේදී වගකීම් පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු සකස් කිරීමට බලාපොරොත්තු වේ	
20	**විගණන ඡේදවලට ප්‍රතිචාර දැක්වීම**			
20.1	ඉකුත් වර්ෂ සඳහා විගණකාධිපති විසින් නිකුත් කළ විගණන ඡේද මඟින් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කොට තිබීම	අනුකූල නොවේ	විගණන ඡේද කිහිපයකට අදාළ ක්‍රියාමාර්ග අවසාන වී නොමැත	අදාළ කටයුතු කරමින් පවතී

අවසානය :

රාජ්‍ය ප්‍රතිපත්ති, රජයේ සංවර්ධන ක්‍රියාදාමය ඇතුළුව ජාතික වැදගත්කමකින් යුතු කාලීන ක්‍රියාකාරකම් සහ ජනතාව වෙනුවෙන් රජය මඟින් ඉටු කරනු ලබන කාර්යභාරය පිළිබඳව මහජනතාව දැනුවත් කිරීම මෙම දෙපාර්තමේන්තුවේ ප්‍රධාන වගකීම හා කාර්යභාරය වන අතර වෙනස්වන ගෝලීය තාක්ෂණ ප්‍රවනතාවන්වලට අනුගත වෙමින් තොරතුරු තාක්ෂණ ක්‍රියාවලිය කළමනාකරණය කර, නිදහස් හා වගකිව යුතු උසස් මාධ්‍ය සංස්කෘතියක් ගොඩනැඟීම සඳහා අනුබල දීම හා නායකත්වය සැපයීම ද ප්‍රධාන අභිමතාර්ථයන් වේ.

මෙකී කාර්යභාරය සාක්ෂාත් කරගනු වස් එනම්, යහපත් මාධ්‍ය සමාජයක් ගොඩනැඟීම සඳහා අවශ්‍ය වන්නා වූ පසුබිම ලාංකේය සමාජය තුළ ස්ථාපිත කිරීමට උපයෝගි කර ගනු ලබන ප්‍රතිපත්ති සැකසීම, දෙපාර්තමේන්තු කාර්ය මණ්ඩලය පාලනය, අමාත්‍යාංශ සහ අනෙකුත් රාජ්‍ය සහ පෞද්ගලික ආයතන සමඟ රාජකාරීමය සම්බන්ධතා පවත්වාගෙන යාම ආදිය සඳහා දෙපාර්තමේන්තුව සිය කාර්යමණ්ඩලය මෙහෙයවන අතර එහිදී එකී නිලධාරීන්ට සිය වගකීම් ඉටු කර ගැනීමට අවශ්‍ය කරන දැනුම, හැකියාව හා පරිසරය සකස් කර දෙනු ලබයි.

මේ තුළ වැඩි අවධානයක් දෙපාර්තමේන්තුව පිහිටුවීමේ මූලික අරමුණු කෙරෙහි යොමු කෙරෙන අතර දෙපාර්තමේන්තුවේ සියලුම අංශ එකී අරමුණු සාක්ෂාත් කර ගැනීම පිණිසම ක්‍රියාත්මක වේ.

රජයේ සංවර්ධන පුවත් ජනතාව වෙත සම්ප්‍රේෂණය කිරීමේ භූමිකාව මෙන්ම ඒ හා ඇදුනු තවත් අරමුණු සාක්ෂාත් කර ගනු වස් ක්‍රියාත්මක රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව, ඒ වෙනුවෙන් විවිධ ක්‍රියාකාරකම් සිය සැලසුම් තුළ අන්තර්ගත කර වසර මුලදී එකී සැලසුම් සඳහා අමාත්‍යාංශ අනුමැතිය ලබා ගනී.

ඉන් අනතුරුව වසර පුරා එකී සැලසුම් ක්‍රියාත්මක කිරීමට අදාළ ක්‍රියාකාරකම්වල නිරත වන අතර එමඟින් සාක්ෂාත් කර ගැනීමට වෙර දරන අරමුණු මූලික වශයෙන් පහත පරිදි පෙළගැස්විය හැක.

- ප්‍රමිතිගත මාධ්‍ය සම්ප්‍රදායක් ඇති කිරීම
- තොරතුරු දැන ගැනීමේ අයිතිය ප්‍රවර්ධනය කිරීම සඳහා රජයේ සංවර්ධන වැඩසටහන් වැඩපිළිවෙල පිළිබඳව තොරතුරු මහජනතාව වෙත ගෙන යාම
- මාධ්‍ය විමර්ශන ක්‍රියාවලිය ශක්තිමත් කිරීම
- යහපාලනය, සංහිඳියාව, තිරසාර සංවර්ධනය ස්ථාපිත කරමින් ප්‍රකාශනයේ හා භාෂණයේ නිදහස තහවුරු කිරීම
- මාධ්‍ය ක්ෂේත්‍රයට අදාළ පර්යේෂණ කටයුතු, සංවර්ධන හා සැලසුම් ඇති කිරීම

ඉහත අරමුණු සාක්ෂාත් කරගනු වස්, දෙපාර්තමේන්තුව විසින් ක්‍රියාත්මක කරනු ලබන ප්‍රධාන ක්‍රියාකාරකම් පහත පරිදි වර්ග කළ හැක.

- අනෙකුත් අමාත්‍යාංශ විසින් ඉටු කරනු ලබන කාර්යයන්ට අදාළ දැනුවත් කිරීමේ වැඩසටහන් (මාධ්‍යවේදීන්, පාසල් සිසුන්, මාධ්‍ය ලේකම්වරුන් හා අනෙකුත් පාර්ශව)
- මාධ්‍ය සාකච්ඡා සංවිධානය කිරීම (කැබිනට් තීරණ දැනුම් දීමේ මාධ්‍ය සාකච්ඡාව හා වෙනත් අමාත්‍යාංශ හා ආයතන කාර්යභාරයට අදාළව)
- ප්‍රවෘත්ති නිවේදන නිකුත් කිරීම
- මාධ්‍ය නිරීක්ෂණ චාරිකා සංවිධානය කිරීම
- සංවර්ධන වැඩසටහන් පිළිබඳ ලිපි හා ප්‍රකාශන ප්‍රකාශයට පත් කිරීම
- නව මාධ්‍ය යොදාගෙන සංවර්ධන වැඩසටහන් පිළිබඳ ප්‍රචාරණය ලබා දීම (Face Book, You Tube, Twitter etc….)
- දෙස් - විදෙස් මාධ්‍යවේදීන් සඳහා මාධ්‍ය හැඳුනුම්පත් නිකුත් කිරීම
- දෛනික විමර්ශන වාර්තා සකස් කිරීම හා අවශ්‍යතාවය මත අදාළ අංශ දැනුවත් කිරීම
- කාලීන වශයෙන් වැදගත් මාතෘකා හා මාධ්‍ය ක්ෂේත්‍රයේ නව ප්‍රවනතා සම්බන්ධයෙන් පර්යේෂණ කිරීම හා වාර්තා ඉදිරිපත් කිරීම
- වාර්තා චිත්‍රපට නිෂ්පාදනය හා ප්‍රචාරය
- ජාතික උත්සව හා සංරක්ෂණය කළ යුතු අවස්ථාවන් ආවරණය හා එකී අවස්ථා ඡායාරූප ගැනීම හා සංරක්ෂණය

මෙලෙස විවිධාකාර භූමිකා හා අරමුණු ඔස්සේ රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව තම දෛනික රාජකාරී කටයුතු වඩා කාර්යක්ෂමතාවයෙන් සහ රාජ්‍ය ප්‍රතිපත්ති හා අරමුණු ඉටු කර ගැනීමට මනා පිටුබලයක් වෙමින් ඉදිරි වර්ෂය සඳහා ද ක්‍රියාත්මක වනු ඇත.



රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව,
163, කිරුළපන ඇවනිව්, පොල්හේන්ගොඩ, කොළඹ 05.

அரசாங்க தகவல் திணைக்களம்
இல.163, கிருலப்பனை மாவத்தை, பொல்ஹேன்கொடை, கொழும்பு 05.

Department of Government Information
No.163, Kirulapone Avenue, Polhengoda, Colombo 05

w w w . d i g . g o v . l k w w w . n e w s . l k